# ක්‍රි.ව. 1986-1989 ජනතා විමුක්ති පෙරමුණේ (ජ.වි.පෙ.) දෙවන සන්නද්ධ අරගලය මර්දනය කිරීම සඳහා භාවිත හමුදාමය ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශනයක්.

**ද සිල්වා, දේව මයිකල්[1*] සහ නවරත්න බණ්ඩාර, ඒ.එම්[2]**

[1*]ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

[2] මහාචාර්ය, දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

විද්‍යුත් තැපැල **:** devamichael@live.com

**සාරාංශය**

පශ්චාත් යටත් විජිත ශ්‍රී ලාංකේය දේශපාලන රටාවේ ගමන්මග වෙනස් කරන ලද විප්ලවකාරී ක්‍රියාමාර්ග දෙකක් පිළිබඳ උදාහරණ නිදහසින් පසු දශක හතරක් ඇතුළත අපට හමු වේ. ඒ අනුව, ජනතා විමුක්ති පෙරමුණ විසින් රාජ්‍ය බලය ලබාගැනීම වෙනුවෙන් අලුතින් අත්හදා බලනු ලැබූ 1971 පළමු අප්‍රේල් සන්නද්ධ අරගලය රාජ්‍ය මර්දනය හමුවේ අසාර්ථකත්වයෙන් කෙළවර වීය. ඉන් අනතුරුව 1986-1989 වර්ෂවල දී දේශප්‍රේමී අරගලයක් තුළින් රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා ජ.වි.පෙ. විසින් දියත් කරනු ලැබූ දෙවන සන්නද්ධ නැගිටීම ද ප්‍රබල රාජ්‍ය මර්දනය හමුවේ අභාවාචක අත්දැකීම් රැසක් උරුමකර දෙමින් විනාශයට පත්විය. මෙලෙස මෙම විමුක්ති අරගල දෙකම ඉතා දරුණු අන්දමින් පැවති රජයන් විසින් මර්දනය කරන ලදී. විශේෂයෙන් 1986 - 1989 වර්ෂවල ජනතා විමුක්ති පෙරමුණේ දෙවන සන්නද්ධ නැගී සිටීමේ දී ඊට එරෙහිව පැවති රජය ස්වකීය ධනේෂ්වර හමුදා මෙහෙයවීම හා එමගින් දේශප්‍රේමී විමුක්ති ව්‍යාපාරයක නිරත වූ ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කළ ආකාරය මෙම අධ්‍යයනයේ දී අපගේ අවධානයට ලක්විය. විශේෂයෙන් ම ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත හා කතුවරයාගේ සහභාගීත්ව නිරීක්ෂණ උපයෝගිකරගෙන මෙම හමුදාමය ක්‍රියාමාර්ග විමර්ශණයට ලක්කොට ඇත. ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ සටන් ව්‍යාපාරය මර්දනය කිරීම සඳහා යොදාගන්නා ලද ප්‍රධාන යුද උපක්‍රම හතරක් මේ යටතේ සාකච්ඡාවට ලක්වේ. සම්මත යුධ උපක්‍රම, ප්‍රතිවිප්ලවීය යුධ උපක්‍රම, මානසික යුධ උපක්‍රම හා අභ්‍යන්තර ආරක්ෂක උපක්‍රම යන මාතෘකා හතර යටතේ මෙම ලිපිය විග්‍රහ කර ඇත. සම්මත යුධ උපක්‍රම යනුවෙන් ධනේෂ්වර හමුදා භාවිත කරන ඉදිරියට යාම, ප්‍රහාරය හා ප්‍රතිවිප්ලවය යන උපක්‍රම මෙහි දී විග්‍රහ කර ඇත. නමුත් සම්මත යන වචනයේ ඇති ලොව පිළිගත්, වඩා යහපත්, බොහෝ දෙනා අනුදැන වදාළ ආදී සාධනීය ලක්ෂණ විමුක්ති සටන් ව්‍යාපාර මර්දනයේ දී ධනේෂ්වර හමුදා තුළින් දැකිය නොහැකි වේ. විශේෂයෙන් ම කැරලිකරුවන්ගේ උපාය හා උපක්‍රම හඳුනාගෙන ඒවා මර්දනයට රජයේ හමුදා ක්‍රියා කළ අන්දම ද අභ්‍යන්තර ආරක්ෂිත උපක්‍රම මගින් සතුරන් දුර්වල කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග ද මෙහි දී විස්තරාත්මකව දක්වා ඇත. ශ්‍රී ලංකාවේ නිදහසින් පසු යුගයේ ඇති වූ විප්ලවකාරී මෙන් ම සන්නද්ධ සටන් ව්‍යාපාරවලින් පොහොසත් වූ

1986-1989 ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ අරගලය හා බැඳි දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ සටන් ක්‍රියාමාර්ග මර්දනයට ඉවහල් වූ හමුදාමය යුද උපක්‍රම හඳුනාගැනීමට මෙම ලිපියෙන් උක්ත ක්ෂේත්‍ර ඔස්සේ උත්සාහ දරා ඇත.

**මුඛ්‍ය පද:** ජ.වි.පෙ, මර්දනය, යුධ උපක්‍රම, සන්නද්ධ අරගලය, හමුදාමය ක්‍රියාමාර්ග

## හැඳින්වීම

ජ.වි.පෙ. මර්දනය කර යුධමය හා දේශපාලනය වශයෙන් විනාශ කර දැමීම සඳහා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ක්‍රියාත්මක වූ ධනේශ්වර හමුදාව විසින් අනුගමනය කරන ලද සටන් උපාය - උපක්‍රම පිළිබඳව සලකා බැලීම වැදගත් වේ. ධනේශ්වර සන්නද්ධ හමුදාවක් යනු සම්ප්‍රදයානුකූල හැඩගැසුම්වලින් හා ක්‍රියා පටිපාටියකින් යුක්ත, ස්ථිර ස්වභාවයක් උරුම කර ගත් යුධ සංවිධානයකි. එය පවතින යල් පැන ගිය ධනේශ්වර සමාජ ආර්ථික රටාව ආරක්ෂා කරන්නකි. එහි සියළුම සටන් ක්‍රියාමාර්ගවල සූදානම වන්නේ සතුරන් අභිබවනය කිරීමේ සෑම හැකියාවක්ම හැම විටම තමන්ට ඇති බව පිළිගැනීමයි. ඒ අනුව ධනේශ්වර හමුදාවක සටන් ක්‍රියාමාර්ගවලදී යුධ උපක්‍රමවලට වඩා හමුදාවේ භට සංඛ්‍යාව (Strength) දියුණු අවි ආයුධ හා ද්‍රව්‍යමය සම්පත් කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. එහි සෑම ක්‍රියාමාර්ගයක දී ම විශාල භට සංඛ්‍යාවක්, විශාල හා දියුණු අවි ආයුධ ප්‍රමාණයක් සහ විශාල ද්‍රව්‍යමය සම්පත් ප්‍රමාණයක් හැමවිටම යෙදීම කෙරෙහි අවධානය යොමු කරයි.

මේ අයුරු ධනේශ්වර හමුදාවක කිසිම ක්‍රියාමාර්ගයක් ජනතාව මත පදනම් නොවන අතර ඒ කෙරෙහි කිසිදු සැලකිල්ලක් හෝ නොදක්වයි. ජාත්‍යන්තර යුධ නීතිය කුමක් වුව ද ඒ සියල්ලටම පටහැනි වූ රාජ්‍ය බලය සුරැකීමේ ක්‍රියාමාර්ග ඔවුන් විසින් අනුගමනය කරනු ලැබේ. ධනේශ්වර හමුදාවල සටන් ක්‍රියාමාර්ගවලට පදනම් වන මූලධර්මයන් ඇත. එනම්, වෙඩි තැබීම හා ගමන් කිරීමයි. (Fire and movement) එය සියළුම ධනේශ්වර හමුදා උපක්‍රමයන්ගේ පදනම වේ. ගෙරිල්ලා යුධ ක්‍රමයට පදනම් වන මූලධර්මය වන පහර දීම හා දිවීම (Hit and Run tactic) යන උපක්‍රමය වෙනුවට එහි සියළුම ක්‍රියාමාර්ග ඉදිරියට යෑම සමඟ සම්බන්ධ වේ. (ද සිල්වා, 1988-1989, ප්‍රමුදිත සටහන්)

## අධ්‍යයන ගැටළුව

ජ.වි.පෙ දෙවන සන්නද්ධ අරගලය පිළිබඳව බොහෝ විද්වතුන් විසින් පර්යේෂණයන් සිදුකර තිබුණ ද එම අරගලය මර්දනය කිරීම සඳහා යොදා ගන්නා ලද හමුදාමය

ක්‍රියාමාර්ග පිළිබඳව මේ දක්වා පර්යේෂකයන් අවධානයක් යොමුකර නොමැති බැවින් ''ජනතා විමුක්ති පෙරමුණේ 1986 - 1989 දෙවන සන්නද්ධ අරගලය මර්දනය කිරීම සඳහා භාවිත හමුදාමය ක්‍රියාමාර්ග කවරේද ?'' යන ගැටළුව ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කිරීමට වග බලා ගන්නා ලදී.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනයේ දී අපගේ අවධානයට යොමු වූයේ *1986-1989 ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීම සඳහා භාවිත වූ යුද උපක්‍රම මොනවාද?* යන ගැටලුවට පිළිතුරු ලබාගැනීම ය. ශක්තිමත් සංවිධාන ව්‍යුහයකින් හා මනා සන්නිවේදන ජාලයකින් දිවයිනේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්තව සිටි සන්නද්ධ සංවිධානයක් සාමාජිකයින් බහුතරයක් ඝාතනය කොට අඩපන කිරීම සඳහා ක්‍රියාත්මක වූ රාජ්‍ය යාන්ත්‍රණය හා එහි උපාය මාර්ග හඳුනාගැනීමට මෙම අධ්‍යයනය වැදගත් වේ. මෙම අධ්‍යයනය මගින් අරමුණු කිහිපයක් මුදුන් පමුණුවා ගැනීමට උත්සාහ දරන ලදී.

1. *ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීම සඳහා රජය සහ ආරක්ෂක හමුදා හා පොලීසිය විසින් අනුගමනය කළ උපක්‍රම හා උපාය මාර්ග හඳුනා ගැනීම.*
2. *ප්‍රති විප්ලවීය යුද උපක්‍රමවල ස්වභාවය අනාවරණය කිරීම.*
3. *සන්නද්ධ සටන් මර්දනය කිරීම හා ගරිල්ලා යුද උපක්‍රම මර්දනය කරනු වස් ධනේෂ්වර හමුදා විසින් යොදාගනු ලබන උපක්‍රම හා උපාය මාර්ග හඳුනාගැනීම.*
4. *සන්නද්ධ අරගලයක් මර්දනය කිරීම සඳහා යොදාගන්නා මානසික උපාය මාර්ග හඳුනාගැනීම.*
5. *විසිවන සියවස අගභාගයේ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ආරක්ෂක උපාය මාර්ගවල ස්වභාවය හඳුනාගැනීම.*

උක්ත අරමුණු සාධනය කරගනිමින් මෙම අධ්‍යයනයේ දී ශ්‍රී ලංකාවේ 1986-1989 සන්නද්ධ සටන් මර්දනය කිරීම සඳහා හමුදාව රැගෙනගිය ක්‍රියාමාර්ග හඳුනාගැනීමට මෙමගින් අප, උත්සාහ දරා ඇත. මෙම විෂය ක්ෂේත්‍රයට අදාළ දත්ත හඳුනාගනිමින් ඒවා විග්‍රහ කරමින් අදාළ කරුණු මතු ප්‍රයෝජනය සඳහා වර්ග කිරීම මෙම පර්යේෂණයෙන් සිදු වී ඇත.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන අධ්‍යයන ක්‍රමවේද කිහිපයක් භාවිතා කරන ලදී. ඒ අනුව දත්ත ඒකරාශී කිරීම සඳහා,

*i . පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය.*

*ii. ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය සහ*

*III. සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතා විය.*

මෙම අධ්‍යයනයයේ පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය මගින් සාහිත්‍ය මුලාශ්‍ර පරිශීලනය කිරිමේ පර්යේෂණ ක්‍රමවේදය මත ගුණාත්මක දත්ත විවරණය කිරිමෙන් නිරික්ෂණ හා නිගමනවලට පැමිණිම සමාජ විද්‍යා ශික්ෂණයේ පර්යේෂණ ක්‍රමවේද මගින් සිදුකරන ලදි. කතුවරයාගේ සහභාගීත්ව නිරීක්ෂණ උපයෝගිකරගෙන *1986-1989 ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීම සඳහා භාවිත වූ යුද උපක්‍රම මොනවාද?* යන්න මෙම පර්යේෂණයේදී අප හඳුනාගෙන, ඒවා වෙන් කොට එක් එක් කඡේත්‍ර ලෙස දැක්විමේ ක්‍රමවේදයක් අප අනුගමනය කරන ලදි. නිරීක්‍ෂණවලට අමතරව සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ද මේ පර්යේෂණය සඳහා තොරතුරු ලබාගන්නා ලදි. ඒවා දුරකථන මාර්ග ඔස්සේ හා සම්මුඛ වී ද සිදුකරන ලදී. ඒ අනුව සමවර්ගිය දත්ත වර්ග කොට අදාල ක්ෂේත්‍ර වෙනම හඳුනාගැනිම සිදුවිය.

**සාකච්ඡාව**

***සාර්ථක සන්නද්ධ අරගලයක් සඳහා පූර්ව කොන්දේසි***

ජ.වි.පෙ. 1971 දී තමන් වෙත එල්ල වූ රාජ්‍ය මර්දනයට එරෙහිව දියත් කළ සන්නද්ධ නැගිටීම නොදියුණු අවි ආයුධ පාවිච්චි කරමින් සිදු කළ ජනතා සන්නද්ධ නැගිටීමකි. එසේ වුව ද 1986 සිට 1989 දක්වා වූ දේශප්‍රේමී අරගලයක් මඟින් රාජ්‍ය බලය ලබා ගෙන මෙරට සමාජවාදී සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීමේ නැතිනම් ජනතා විමුක්ති අරගලයකින් තුළින් සමාජවාදය පිහිටු වීමේ අරමුණින් ක්‍රියාත්මක වූ ජ.වි.පෙ. දෙවැනි සන්නද්ධ නැගිටීම හමුදාමය අතින් කිසියම් ප්‍රමාණයකට පළමුවැන්නට වඩා දියුණු වූවකි. (සම්මුඛ සාකච්ඡාව, කිතුලේගොඩ. 2014.04.01)

### *සන්නද්ධ අරගලකරුවන් විසින් සපුරාගත යුතු අවශ්‍යතා*

සන්නද්ධ අරගලයක් සාර්ථක කර ගැනීම සඳහා අරගලකාරීන් විසින් සපුරාගත යුතු අවශ්‍යතා පිළිබඳව ද අවබෝධයක් ධනේශ්වර හමුදාවට ජ.වි.පෙ. මර්දනයෙහිලා ලබා දී තිබුණේ ය. එම පූර්ව අවශ්‍යතා ලෙස පෙන්වා දී තිබුණේ ජනප්‍රියභාවය හා සහයෝගය, ශක්තිමත් නායකත්වය, මනා ඔත්තු සේවාවක්, සුදුසු ප්‍රදේශ හා බාහිර සහයෝගය යන සාධකයෝ ය.

### *ජනප්‍රියභාවය හා සහයෝගය*

රාජ්‍ය විරෝධී ව්‍යාපාරයක පැවැත්ම උදෙසා නියත වශයෙන්ම ජනතාවගේ සහයෝගය ලබාගත යුතුම වන්නේ ය. එකී ව්‍යාපාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ජනතාව අතර ජනප්‍රිය වීමෙන් ලැබෙන පිටුබලය ඔස්සේ ඔවුන්ගෙන් ආහාර, ඉඳුම් - හිටුම්, වෛද්‍යාධාර, රහස්‍ය තොරතුරු හා අළුතින් සාමාජිකයින් බඳවා ගෙන පෝෂණය වේ. ආණ්ඩුවක් දුර්වලව පවතින විට එය කරන කොට ගෙන සත්‍ය වශයෙන්ම පොදු මහජනතාව පීඩනයට හා දරිද්‍රතාවයට පත්ව සිටින විට විධිමත් වැඩපිළිවෙලක් දියත් කිරීම මගින් නිතැතින්ම ඔවුන්ගේ සිත දිනා ගත හැකි ය. එවැනි අවස්ථාවල දී මහජනයා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී සන්නද්ධ අරගලකරුවන්ට සහාය ලබා දීම ප්‍රමාද වන විට ත්‍රස්තවාදී හා කඩකප්පල්කාරී ක්‍රියාවන් මගින් ජනතාව අවදි කිරීමට උත්සාහ කරති. (අර්නස්ටෝ, 2004: 52)

### *ශක්තිමත් නායකත්වය*

ක්‍රියාකාරී නායකත්වයක් දරන්නා මනා පුහුණුවක් ලද්දෙකුම නොවිය යුතු අතර, එම කාර්ය සඳහා දැඩි කැපවීමක් ඇත්තෙකු පමණක් වීම ප්‍රමාණවත් ය. ඔහු බොහෝ දුරට තද තීරණවලට එළඹෙන දැඩි නිර්භීත, දේශපාලන උපායෙහි දක්ෂ, නිවුණු හා කෲර නොවූ පුද්ගලයෙකු ද වන්නේ ය.

### *මනා ඔත්තු සේවාවක් පවත්වා ගෙන යෑම*

මූලික වශයෙන් සන්නද්ධ අරගලයක පැවැත්ම සඳහා මනා ඔත්තු සේවයක් අවශ්‍ය වේ. ඒ සඳහා කාර්යක්ෂම සංවිධාන ජාලයක් පොදු මහජනතාව අතරත්, රාජ්‍ය තන්ත්‍රය තුළත්, ආරක්ෂක හමුදා තුළත් පිහිටුවාලීමට නිසර්ගයෙන්ම කටයුතු කරනු ලබයි. ඒ මගින්

සැලසුම්කරණය, ප්‍රචාරණය හා ආරක්‍ෂාව සලසා ගැනීම සඳහා අවශ්‍ය කරන තොරතුරු විස්තරාත්මකව ලබා ගැනීමට සෑම නිමේෂයක දීම පාහේ කටයුතු කරනු ලැබේ. (වේ මින්, 2003:90 - 91)

*ප්‍රදේශ හා බාහිර සහයෝගය*

අරගලකාරී අවස්ථාවන්හි දී අවතැන් වන්නා වූ අනාථයන් එක්රැස් කිරීමට, පරිපාලකයන් බිහිකිරීමට පුහුණුව ලබා දීමට හා නිෂ්පාදන ප්‍රදේශ ඇති කිරීමට සුදුසු ප්‍රදේශවල කඳවුරු ආරම්භ කළ යුතු වේ. මෙය වඩා වැදගත් වන්නේ බැහැරින් වන ගිරිදුර්ගවල සිට සටන් මෙහෙයවන අවස්ථාවල දී ය. එවැනි ප්‍රදේශයක දී ගුවනින් හා ගොඩබිමින් ආරක්‍ෂාව අරගලකරුවන්ට වහාම ලැබෙන බැවින් සාමාන්‍ය හමුදාවකට එවැනි තත්ත්වයකට මුහුණ දීම සඳහා ඔවුන් සතු මුළුමහත් ශක්තියම යෙදවීමට සිදුවේ. ජනාකීර්ණ ප්‍රදේශවල සිට මහජනතාවගේ රැකවරණය ලබා සතුරා සටන් වදිනවාට වඩා මෙය බෙහෙවින් වෙනස් ය. එවැනි ජනාකීර්ණ ප්‍රදේශ අරගලකරුවන් භාවිතා කිරීමට ඉඩ ඇත. බාහිර සහයෝගය යටතේ පුහුණු කිරීම්, අරමුදල් සම්පාදනය, උපකරණ ලබාදීම් හෝ හමුදා මෙහෙයුම් ලබා දීමට හෝ නොහැකි බව සැලකිල්ලට ගත යුතුය.

*සන්නද්ධ අරගලකරුවන්ගේ උපාය හා උපක්‍රම*

සන්නද්ධ අරගලකරුවන්ගේ සැලසුම්වල මූලික ස්වරූපය දෙස බලනවිට සන්නද්ධ අරගලයක් සඳහා ගෙනයන ව්‍යාපාරයේ උපාය දීර්ඝකාලීනව පවත්වා ගෙන යාමට උත්සුක වන බව පෙනේ. ඒ අතරතුර සාමාන්‍ය පොදු ජනයාගේ සහයෝගය ලබා ගැනීම අරමුණු කොට ගෙන ජනාකීර්ණ ප්‍රදේශ පියවරෙන් පියවර දිනාගැනීමට නැතිනම් අත්පත් කරගැනීමට අදහස් කරයි. මේ අතර සම්පූර්ණ සැලැස්ම අදියර තුනකින් (03) සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරයි. (අර්නස්ටෝ, 2004: 70,95, 107) එනම්

- අ. රාජ්‍ය යන්ත්‍රය තුළටත්, පාලන තන්ත්‍රය තුළටත්, බහුජන සංවිධාන තුළටත් රිංගා ගෙන කටයුතු කිරීම.
- ආ. ත්‍රස්තවාදී ක්‍රියා උපයෝගී කොට ගෙන ආණ්ඩුවට බලපෑම් කිරීම හා කඩාකප්පල්කාරී ක්‍රියා ඇති කිරීම තුළින් අවිනිශ්චිතභාවයක් ගොඩනැගීම.
- ඇ. සැඟ වී සටන් කිරීමේ ගෙරිල්ලා යුධක්‍රම භාවිතා කිරීම.

එමෙන්ම අරගලකරුවන්ගේ සැලසුම්වල උපක්‍රම ද සැලකිල්ලට ගත යුතුය.

i. විශ්මයජනක ක්‍රියාවන් ගැන විශ්වාසය තබමින් පිළිගත හැකි ක්‍රම උපයෝගී කර ගනිමින් සිතාමතා කටයුතු කිරීම හා නම්‍යශීලීභාවයකින් ක්‍රියා කිරීම.

ii. තාවකාලික ආරක්ෂාවක් යටතේ වුව ද අවදානම නොතකා ප්‍රහාර එල්ල කිරීම.

iii. කොපමණ දුරක වුව ගමන් කිරීමෙන් තම අරමුණ ඉටු කරගැනීම.

iv. රාත්‍රී කාලයේ ප්‍රහාර සඳහා විශේෂ හැකියාවකින් යුක්ත වීම.

iv. ප්‍රහාරයක් එල්ල කිරීමට හෝ ඒ සඳහා මනා ලෙස සූදානම් වීමත්, ඉමහත් කායික හා මානසික ශක්තියකින් සිටිමින් වාසිදායක තත්ත්ව උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමේ දක්ෂතාවයකින්

යුක්ත වීම.

vi. සියළුම ආකාරයේ සැඟවී සිට පහරදීමේ ක්‍රම නිතර භාවිතා කිරීම.

vii. මර උගුල්, අතුරන ලද වෙඩි (බිම් බෝම්බ), නවීන බාධක වලවල් (උල් සිටුවීම), කැපෙන මුවාත ඇති උණු පතුරු හා බ්ලේඩ් වැනි දෑ සිටුවීම හා සවි කිරීම, බොරු වළවල් ෂෙවාස් (Shevash), අකුල් වැල්, රැහැන් ඇද පැටලෙන්නට සැලැස්වීම.

viii. ස්වාභාවිකව පිහිටා ඇති බාධකවලට අමතරව කෘතීම වශයෙන් ගොඩනගන ලද බාධක ද සහිතව මනාව ඉදි කළ ආරක්ෂක ගම්මාන ප්‍රයෝජනයට ගැනීම.

*මේ තත්ත්වය තුළ ජ.වි.පෙ.ට එරෙහිව පැවති රජය ස්වකීය ධනේෂ්වර හමුදා මෙහෙයවීම හා එමගින් සන්නද්ධ අරගල ව්‍යාපාරයක නිරත වූ ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කළ ආකාරය සැලකිල්ලට ගත යුතුය. (වන්නිආරච්චි, සම්මුඛ සාකච්ඡාව, 2014.04.30)*

### ***සන්නද්ධ සටන් ව්‍යාපාරය මර්දනය කිරීම සඳහා භාවිත දේශපාලන හා හමුදාමය ක්‍රියාමාර්ග***

ජ.වි.පෙ. ට විරුද්ධව රාජ්‍ය හමුදා ක්‍රියාත්මක වූ 1986 - 1989 කාලයේ දී පාබල හමුදාවක් අනුගමනය කරන ලද සටන් උපක්‍රම ප්‍රධාන යුධ උපක්‍රම හතරකට (04) බෙදිය හැකිය. එනම් සම්මත යුධ ක්‍රම ප්‍රති විප්ලවීය යුධ උපක්‍රම, මානසික යුධ උපක්‍රම හා අභ්‍යන්තර ආරක්ෂාව වශයෙනි. මේ සැම ආකාරයකින්ම සම්මිශ්‍රණය වූ යුද්ධයයක් ධනේශ්වර හමුදාව විසින් ජ.වි.පෙ.ට විරුද්ධව අනුගමනය කළේ ය.

***සම්මත යුධ ක්‍රම***

සම්මත යුධ ක්‍රම යනු ඉතිහාසය තුළ අනුගමනය කළ සටන් ක්‍රම ආකෘති (Modles) හා හැඩගැසුම් (Formationn) ඒ අයුරින්ම යොදා ගනිමින් කරනු ලබන සටන් ක්‍රියාමාර්ග වේ. මේ දක්වා ධනේශ්වර හමුදාවක ප්‍රධාන සටන් ක්‍රමය වන්නේ සම්මත යුධ ක්‍රමයයි. යුධ ඉතිහාසයේ ප්‍රධාන සටන් විධික්‍රමය වූ මුහුණට මුහුණලා (Assault) කරනු ලබන ක්‍රියාමාර්ගවලට ගැලපෙන පරිදි සම්මත යුධ ක්‍රම හැඩ ගැසී ඇත. විවෘත සටන් බිමක හමුදාවේ ශක්තිය මත හා දක්ෂතාවය මත කරනු ලබන ප්‍රහාරය න් මෙයට අදාළ වේ. මෙම සටන් ක්‍රම බොහෝමයක් සූත්‍රගත කර තිබේ. ඒවා සරඹ (Drill) වශයෙන් පුහුණු කරනු ලබයි. නිදසුනක් ලෙස  පෙළ සරඹ (Section Battle drill) හා කාණ්ඩ යුධ සරඹ (Platoon Battle drill) දැක්විය හැකිය. මෙම සම්මත යුධ ක්‍රම ප්‍රධාන ආකාර 4 කින් යුක්ත වේ. එනම් ඉදිරියට යාම, ප්‍රහාරය, ආරක්ෂාව හා පසුබැසීම වේ.

***ඉදිරියට යෑම (Advance)***

මෙහිදී යුධ බිමක, සතුරු බිමක හා සම්මත බිමක ප්‍රහාර එල්ල කිරීමේ අරමුණින් ඉදිරියට යෑම පිළිබඳව සාකච්ඡා කෙරේ. එසේ ඉදිරියට යාමේ දී විවිධ පරිසර හා දේශගුණික තත්ත්වයන් යටතේ හමුවන විවිධ බාධක තරණය කිරීමත්, වෙඩි ඇතිරූ බිම්, මරඋගුල් ආදිය තරණය කිරීමත්, ආරක්ෂා වෙමින්, සැඟවෙමින් හා වෙස්වලා ගනිමින් හදිසියේ මතුවන සතුරාට එරෙහිව ක්‍රියාමාර්ග ගනිමින් ඉදිරියට යෑමත් අදාළ වේ. මෙයට අදාළව ද පෙළ යුධ සරඹ (Section Battle drill) හා ඛණ්ඩ යුධ සරඹ (Platoon Battle drill) යනුවෙන් සරඹ දෙකක් වේ. පෙළක්  ගමනේ යාමේ දී හදිසියේ ඇතිවන ප්‍රහාරයකට මුහුණ දෙන ආකාරයත්, ප්ලැටූනයක් ගමනේ යාමේ දී හදිසියේ ඇතිවන ප්‍රහාරයකට මුහුණ දෙන ආකාරයක් මෙහිදී විස්තර කෙරේ. එමෙන්ම ඉදිරියට යාමේ දී බාධක තරණය කිරීමත්, බාධක ඉඳි කර ගැනීමත් අදාළ වේ. ප්‍රහාරය සඳහා තාවකාලික බාධක, යුධ අගල් (Trenches), ආරක්ෂක පවුරු (Bunkers) ආදිය ගොඩනගා ගැනීම ද මෙයට අයත් වේ. (Haycock and Neilson,1989:10)

***ප්‍රහාරය (Attack)***

සතුරා හමුවට ඉදිරියට යාමේ දී හා සතුරා මුණගැසීමේ දී විවිධ ආකාරයෙන් ප්‍රහාරයන් එල්ල කරන ආකාරය මෙහිදී විස්තර කෙරේ. සමාජ විද්‍යාත්මක සංකල්පයක් වන ''ප්‍රතිසමාජානුයෝජනය'' යටතේ  කිසියම් පුද්ගලයෙකු හුරුවී ඇති පරිසරයට ඉතා වෙනස්

වූ පරිසර වටපිටාවක හැසිරීමට පුහුණු කිරීම හෙවත් හමුදා භටයකුගේ පෞරුෂත්වය සම්පූර්ණ වෙනසකට භාජනය කිරීම යුධ සරඹ පුහුණුව තුළින් සිදු කරනු ලබයි. පහත දක්වනු ලබන පෙළ යුධ සරඹ, (Section Battle Drill), බණ්ඩ යුධ සරඹ (Platoon Battle Drill), රැකසිට පහරදීම (Ambush), ප්‍රති රැකසිට පහරදීම (Re Ambush), මුණ ගැසීමේ සරඹය (Assault Drill), සුදානම් කරන ලද ප්‍රහාර (Deliberate Attack), ක්ෂණික ප්‍රහාර (Quick Attack), රාත්‍රී ප්‍රහාර (Night Operations), ශක්තිමත් ස්ථානවල ප්‍රහාර (Attack to the Strong points), නාගරික පරිසරයක ප්‍රහාර එල්ල කිරීම (Build of Area Operation), යන සියල්ලම පිළිබඳව ලබාදෙන උපදෙස් හා පුහුණුව සරඹ යනුවෙන් සැලකුව මනාය.

යුධ සරඹ යනු 18 වන ශත වර්ෂයේ පෞරාණික යුද උපක්‍රමවල ආභාෂයෙන් බිහි වුවකි. එහි එන පෙළ සරඹ යටතේ ක්‍රමානුකූලව සිට ගැනීමටත් බණ්ඩ යුධ සරඹ යටතේ අසමමිතික භූමියක පවා පිළිවෙලකට, සංවරව කණ්ඩායමේ අනෙකුත් සෙබළුනට සාපේක්ෂව ගමනේ යාමට සහ විශේෂයෙන් ඉක්මන් විධානයන් නියමානුකූල ලෙස පිළිපැදීමට හුරුපුරුදු කරවමින් යුධ භටයා තුළ මෙන්ම සමස්ත කණ්ඩායම තුළ විධාන පිළිබඳව සහජ අවනත බවක් ඇති කරවන්නේය. එපමණක් නොව යුධ බිමේදී මමත්වය සහ ඒකාබද්ධතාවය දියුණු කරවමින් යුධමය කාර්යයට මූලික අඩිතාලමක් දමනු ලැබේ. මේ ආකාර වූ සරඹ මගින් නායකත්ව සංවර්ධනයක් ද ඇති කරවමින්, තදබල ශාරීරික ප්‍රායෝගික පුහුණු කිරීම් ඔස්සේ සතුරාගේ ක්‍රියාකරකම් ඉතා නිවැරදි ලෙස මර්දනය කිරීමට හැකි වන්නේය. තවත් අතකින් හමුදාවක් යනු අවි අත දරා සිටින සැහැසි ම්ලේච්ඡ පිරිසක් නොව වැදගත් සංයමයකින් යුත් හික්මුණු පිරිසක් බව ද පෙන්නුම් කරයි.

රැක සිට පහරදීම (Ambush), වනචාරී ගෝත්‍රවලින් ඉගෙන ගත් සටන් ක්‍රමයකි. මෙවැනි ප්‍රහාර එල්ල කිරීමකදී උපරිම ආරක්ෂාව, වෘත්තීය නිපුණතාව සහ බුද්ධි තොරතුරු දැඩි සැලකිල්ලකින් පදනම් කරගනු ලබයි. අතීතයේ දී රැක සිට පහරදීමේ ක්‍රියාන්විතයන් සඳහා විශාල හමුදාවන් යොදවන ලදි. විශේෂයෙන් ගමන් කිරීමට අපහසු ගිරි දුර්ග මැදින් වැටී ඇති නිම්න වැනි මර්මස්ථාන මේ සඳහා යොදා ගත්තේය. උදාහරණයක් ලෙස උඩරට ගෙරිල්ලා හමුදාවෝ ඉංග්‍රීසි හමුදාවට එරෙහිව රැක සිට පහරදීම සඳහා කඩුගන්නාව හා බලන වැනි දුර්ගයන් යොදා ගනු ලැබීය. රැකසිට පහරදීමක අරමුණ වනුයේ සතුරු පාර්ශ්වයෙන් එල්ලවන තර්ජන හා අභියෝග වළක්වා ගැනීමය. එසේම සතුරා විසින් පවත්වා ගෙන යනු ලබන වැඩපිළිවෙල හා අනාගත සැලසුම් අවුල් වියවුල් කර භීතියට හා සන්ත්‍රාසයට පත්කර චිත්ත ධෛර්යය විනාශ කර දැමීමය. මෙබඳු රැක සිට පහරදීමකදී පූර්වගාමීව තොරතුරු සොයා බැලීම, ප්‍රහාරය සඳහා ස්ථානයක් තෝරා ගැනීම,

ස්ථානගතවීම, ප්‍රහාරය හා ආපසු පසුබැසීම හෙවත් පැමිණීම යන පියවර අනුපිළිවෙල යටතේ මනා සැලැස්මක් සකස් කොට පහරදීමේ ක්‍රියාන්විතයට අවතීර්ණ විය යුතු වේ. (වන්නිආරච්චි, සම්මුඛ සාකච්ඡාව, 2014.04.30)

මේ හැරුණු විට ප්‍රති රැක සිට පහරදීමකින් (Re Ambush), අපේක්ෂා කරනුයේ සතුරු පාර්ශවය වික්ෂිප්තභාවයකට පත් කිරීමය. තමන්ට එල්ලවන සතුරු ප්‍රහාරයකට එරෙහිව එකට එක කිරීමක් ලෙස නැතිනම් පළිගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සැඟවී සිට සතුරාට පහරදීම මෙහිදී සිදු කෙරේ. වෛරීය චේතනාව පෙර දැරිකරගත් මේ ප්‍රති රැක සිට පහරදීම් සතුරා බිඳ වැට්ටවීමේ මානසික යුධ උපක්‍රමයක් ලෙස මෙන්ම තම පිළේ ජීව ගුණය වැඩි වර්ධනය කර ගැනීම සඳහා ද යොදා ගැනේ.

ඈත අතීතයේ දි විවෘත යුධ භූමියක් තුළ සතුරු පාර්ශ්ව දෙකක් මුහුණට මුහුණ මුණ ගැසී යුද්ධ කිරීම හෙවත් මුණ ගැසීමේ සරඹය (Assault Drill) සිදුවිය. එමෙන්ම විප්ලවවාදී හමුදාවන් හෝ ත්‍රස්ත හමුදාවන් ක්‍රමානුකූලව වර්ධනය වී මහජන හමුදාවක් බවට පරිවර්තනය වීමෙන් අනතුරුව බොහෝ දුරට සතුරු පාර්ශ්වයේ දියුණු ශක්තිමත් හමුදා සමග මුහුණට මුහුණලා සටන් කිරීමට පෙළඹෙන අවස්ථා දැකිය හැකිය.

යුධ විද්‍යාවේ එන අසම්මත යුධ උපක්‍රම ලෙස ගෙරිල්ලා ව්‍යාපාරයන් විසින් සතුරු හමුදා ඉලක්ක කර ගනිමින් මනා සැලසුමක් ඔස්සේ විධිමත්ව සූදානම් කරන ලද දැවැන්ත ප්‍රහාරයන් (Deliberate Attack) එල්ල කිරීම දැකිය හැකිය. එසේම සතුරා කිසිසේත් බලාපොරොත්තු නොවන අවස්ථා තෝරාගෙන ක්ෂණික ප්‍රහාර (Quick Attack) සහ රාත්‍රී ප්‍රහාර එල්ල කිරීම (Night Operations) සිදු කෙරේ. සාමාන්‍යයෙන් ධනේශ්වර යුධ හමුදා ඉගැන්වීම්වලට අනුව ශක්තිමත් ස්ථානවලට ප්‍රහාර එල්ල කිරීමෙන් (Attack to the Strong Points) වලකින ලෙස උගන්වනු ලබයි. එනිසාම ගෙරිල්ලා කණ්ඩායම් විසින් සතුරු පාර්ශවයේ ශක්තිමත් ස්ථාන ඉලක්ක ගත කර ප්‍රහාර එල්ල කිරී දැකිය හැකිය. එසේම ජනාකීර්ණ නාගරික ප්‍රදේශවල විප්ලවවාදී ව්‍යාපාරවලට වර්ධනය වීමට ඇති ඉඩකඩ ඉතා අඩු බැවින් අවම සම්පත් භාවිතා කර නාගරික මුඩුක්කු හා කර්මාන්ත ශාලා ආශ්‍රිතව සැරිසරමින් සුළු අවි යොදා ගනිමින් නාගරික ප්‍රදේශවල ප්‍රහාර එල්ල (Build of Area Operation) කරනු ලැබේ.

### *ආරක්ෂාව හා පසුබැසීම* ***(Defence and Withdrawal)***

සම්මත යුධ ක්‍රම අනුව හමුදාව ඉදිරියට යාමේ දී ත්, ප්‍රහාරයේ දී ත්, පසුබැසීමේ දී ත් හමුදාව ආරක්ෂා කරගනු වස් අනුගමනය කරන විධි විධාන මෙහි දී සාකච්ඡා කෙරේ. පසුබැසීම යටතේ යම් කාර්යයක නියුක්තවීමෙන් පසුව හෝ හදිසියේ හෝ පසුබැසීමට තීරණයක් ගතහොත් එය සිදු කරන ආකාරය විස්තර කෙරේ. සම්මත යුධක්‍රමවල ඇතුළත් ආකාර හතරටම (04) අදාළ සූත්‍රගත කිරීම් දක්නට ලැබේ. ප්‍රබල හමුදාවක මූලික පුහුණුව මේ සටන් ක්‍රම පිළිබඳ පුහුණුවකින් යුක්ත වේ. ඉන්දියන් හමුදාවේ සම්මත යුධ ක්‍රමවල දී පසුබැසීම (Withdrawal) ඉවත් කර ඇත. එයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ ඒ තුළින් හමුදාවක් මන්දෝත්සාහීවීමට ඉඩ ඇති බවයි. වර්තමානයේ යුද්ධයේ භාවිතය තුළ සම්මත යුධ ක්‍රමවල සාපේක්ෂ වැදගත්කම එන්ට එන්ටම අඩුවීමක් දැකිය හැකිය. දිග්ගැස්සුණු ගෙරිල්ලා යුද්ධයක දී සම්මත යුධ ක්‍රම භාවිතය අසාර්ථකත්වයට මුහුණ දී ඇති බව පරාජයන් තුළින් ධනේශ්වර හමුදා ඉගෙන ගෙන ඇත. විවෘත සටන් බිමක් නොමැති වීමත් බලාපොරොත්තු රහිතව සිදු කෙරෙන හදිසි ප්‍රහාර නිසාත්, සම්මතයෙන් බැහැර වූ වෙනත් සටන් උපක්‍රම කෙරෙහි අද වනවිට ධනේශ්වර හමුදාවනට අවධානය යොමු කිරීමට සිදු වී තිබේ.

### *ප්‍රතිවිප්ලවීය යුධ ක්‍රම* ***(Counter Revolutionary Warfare)***

ධනේශ්වර යුධ විශේෂඥයින් විසින් මෙය හඳුන්වනු ලබන්නේ ප්‍රති ත්‍රස්තවාදී යුධ ක්‍රම වශයෙනි. සන්නද්ධ අරගලකරුවන් බිහිවන හා හැඩගැසෙන අයුරුත්, ඔවුන්ගේ ප්‍රහාරක යුධ ක්‍රම වළකාලමින් විප්ලවීය යුද්ධයේ දී මර්දන කටයුතු දියත් කළ යුතු ආකාරය පිළිබඳව මෙමගින් සාකච්ඡා කෙරේ. සාමාන්‍යයෙන් සන්නද්ධ අරගලකරුවෙකු තමාගේ මරණය ගැන තැකීමක් නොකරන අතර ඒ පිළිබඳව දෙගිඩියවෙන්ද පසු නොවේ. මානසික ප්‍රතිවිරුද්ධතා ඔහු තුළ නැති අතර, හැඟීම්වලට වහල් වීමක් සිදුවෙනවා නම් ඒ මඳ වශයෙනි. ඔහු ක්‍රියාත්මක වන්නේ මරුවිකල්ලෙන් හෝ මිලේච්ඡයකු ලෙස ද නොවේ. ඔහු සැදී වැඩී ඇත්තේත්, පුරුදු පුහුණු වී ඇත්තේ ත්, දුෂ්කර ජීවන තත්ත්වයකට ඔරොත්තු දෙන අයුරිනි. ඔහු මද විවේකයෙනු ත්, මද පහසුවෙනු ත් තෘප්තිමත් වන අතර, තමන් ගැන තමන්ම බලා කියා ගැනීමට උත්සාහ දරන්නෙකි. එදිනෙදා රටේ සිදුවන දේවල් දෙස විමසිල්ලෙන් හා මනා සංයමයකින් යුතුව බලා සියුම් ලෙස හා ඉතා ඉක්මනින් විග්‍රහ කර ගැනීමේ හැකියාවක් ද, ඒවා ගැන තීරණ ගැනීමේ හැකියාවක් ද ඇත. නවීන සංකීර්ණ යුධ අවි පිළිබඳව මනා පුහුණුවක් ද ලබා ඇත. (ද සිල්වා, 1988 - 1989, ප්‍රමුදිත සටහන්)

***සන්නද්ධ අරගලයක් සාර්ථකව මැඩ පැවැත්වීමට අවශ්‍ය සාධක***

සන්නද්ධ අරගල මර්දන ක්‍රියාදාමයක දී විශේෂයෙන් භාවිතා කළ හැකි ක්‍රම මෙයින් පැහැදිලි කරයි.

### i. ඒකාබද්ධ මෙහෙයුම් (Joint Operations)

සන්නද්ධ අරගල මර්දන කටයුතු දියත් කළ යුත්තේ ඒකාබද්ධ ක්‍රියාමාර්ගයක් වශයෙන් හා පුරවැසි හමුදා අංශවලින් සමන්විත කමිටුවක මෙහෙයවීම යටතේ ය. එමෙන්ම මෙයට දේශපාලන බලය ද සම්බන්ධ කර ගත යුතුවේ. පරිපාලන ක්ෂේත්‍රයේ නිලධාරින් හා හමුදා අතර තිබිය යුතු වඩා කිට්ටු අන්‍යෝන්‍ය අවබෝධයය හා සහයෝගයේ ඇති විශාල වැදගත්කම අමතක නොකළ යුතුය.

### ii. පොදු ජන මානසිකත්වය හා හැඟීම්

බලයේ පවතින ආණ්ඩුව හා හමුදාව කෙරෙහි මහජන ප්‍රසාදයක්, ගෞරවයක්, භක්තියක් හෝ විශ්වාසයක් නොමැතිව සන්නද්ධ අරගලයක් මැඩ පැවැත්වීම දුෂ්කරය. මහජනතාව රජයට හා හමුදාවට උදව් කරන්නේ නම් පමණක් අරගලකරුවන් කොටුකර ගැනීමටත්, ඔවුන්ගේ සැපයුම් මාර්ග අඩාල කිරීමටත්, ඉඳුම් - හිටුම් හා රහස් ඔත්තු සේවා අඩපණ කිරීමටත් හැකි වේ.

### iii. රහස් ඔත්තු සේවාවන්

කාර්යක්ෂමව අස්සක් මුල්ලක් නෑරම පැතිරුණු රහස් ඔත්තු සේවාවක් අත්‍යාවශ්‍යය. එය පාලනය කිරීම හා සැලසුම් කිරීම ජාතික පදනමකින් කළ යුතු ය. කැරැලිකරුවන්ට විරුද්ධව හමුදාමය ක්‍රියා මාර්ගය ගැනීමට පෙර ඔවුන් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමත්, පොලිස් රහස් ඔත්තු සේවාවක් මගින් පිළියෙල කළ වැඩ පිළිවෙලවල් ගැනත් සොයා බැලිය යුතුය.

### iv. කඳවුරුවල ආරක්ෂාව

ස්ථිර කඳවුරු, තාවකාලික කඳවුරු, කුඩා හමුදා ඒකක, පොලිස් මුරපොළවල් හෝ සංචාරක මුර කඳවුරු ආදී කුමන කඳවුරක් වුව ද විශේෂත්වයකින් තොරවම ආරක්ෂා කිරීමට විධිවිධාන යෙදීම අත්‍යාවශ්‍ය වේ.

### v. සැලසුම්ගත ප්‍රහාරක වැඩපිළිවෙල

බලය අල්ලා ගත් ප්‍රදේශයේ බලය ප්‍රබල කිරීම ත්, බලය ව්‍යාප්ත කිරීම ත් යන දෙකම ක්‍රම ක්‍රමයෙන් පියවරෙන් පියවර ක්‍රියාත්මක කළ යුතුය. රටේ බලය අල්ලා ගන්නා ආකාරය පදනම් කර ගෙන සන්නද්ධ අරගල මර්දන ක්‍රියා මාර්ග සැලසුම් කළ යුතුය.

බොහෝ අවස්ථාවල දී විප්ලවවාදී ව්‍යාපාර විසින් ගෙරිල්ලා හමුදාවට අමතරව නිත්‍ය හමුදාවක් ද පවත්වා ගෙන යයි. මේ තත්ත්වය ආරක්ෂක හමුදාවන්ට ලොකු ප්‍රශ්නයක් වන අතර සමහර විට ගෙරිල්ලන් මෙල්ල කිරීම සඳහා විසිරී සිටින විට සන්නද්ධ අරගලකාර හමුදා මගින් එල්ල කරනු ලබන ප්‍රහාරයකින් විපතක් සිදු වීමට ඉඩ තිබේ. එමෙන්ම අරගලකාර හමුදාවට ප්‍රහාර එල්ල කරන විට ගෙරිල්ලා හමුදාවේ ප්‍රහාර නිසා ආරක්ෂක හමුදා දුෂ්කර තත්ත්වයකට පත්වීමත්, ඇතැම්විට රට ඇතුළත පාලනය අහිමිවීමටත් ඉඩ ඇත.

### vi. සතුරු බලය බිඳහෙළීම හා බලය රැක ගැනීම.

මේ සඳහා අවශ්‍ය වනුයේ පැහැදිලි දේශපාලන ප්‍රතිපත්තියක පිහිටා සතුරාට පහරදීමේ ක්‍රියාමාර්ගයක් ආරක්ෂක හමුදා විසින් අනුගමනය කිරීමයි. ආරක්ෂක හමුදා තුළ ආක්‍රමණික මානසිකත්වයක් පවත්වා ගෙන යා යුතුය. ආරක්ෂක හමුදා ක්‍රියාත්මක වන ප්‍රදේශ තුළ බලය රැක ගැනීම සඳහා ගතයුතු සෑම ක්‍රියාමාර්ගයක්ම නොපමාව ගත යුතුය.

### vii. හමුදා ක්ෂණික විසුරාවාලීම හා නම්‍යශීලීභාවය (Rapid Deployment and Flexibility)

කැරැළිකරුවන්ගේ තත්ත්වය තුළම පුරුදු පුහුණු කරන ලද ආරක්ෂක හමුදාවක් ඒ ආකාරයටම සන්නද්ධ කොට බොහෝ කාලයක් ක්‍රියාත්මක වන්නට ඉඩ හැරිය යුතු අතර, ගුවනින් හමුදාව රැස්කිරීම ආදිය මගින් ක්‍රියාමාර්ග වේගවත් කිරීමත්, සුපරීක්ෂාකාරීවීමත්, නම්‍යශීලී පරිපාලනයක් පවත්වා ගෙන යෑමත් කළ යුතුය.

### viii. විශ්මය ජනකභාවය හා ආරක්ෂාව

සැලසුම් ඉතා රහසිගතව සකස් කිරීම මගින් විශ්මය ජනකභාවය පවත්වා ගෙන යා හැකි ය. විශ්මය දනවන අයුරින් සටන් වැදීමට අපොහොසත්වීම ක්‍රියාමාර්ගයක අසාර්ථකභාවයටත්, එයම හේතු කොට ගෙන බලය ගිලිහී යාමටත් බලපෑ හැකිය.

***ජනතා විමුක්ති පෙරමුණේ විමුක්ති සටන් මර්දනය කිරීම සඳහා භාවිත හමුදාමය ක්‍රියාමාර්ග***

මුර සංචාර (Partrols) මෙහි ප්‍රධාන අරමුණ වන්නේ විවිධ ක්‍රියාමාගී අතර ඒකත්වය තහවුරු කරලීමත්, ගැඹුරින් කෙරෙන ක්‍රියාමාර්ගවලට පිටුබලයක් සැපයීමත් ය. මෙහිදී අරගලකරුවන්ගේ ක්‍රියාකාරීත්වයට බාධා පැමිණවීමත්, තොරතුරු රැස්කර ගැනීමත්, ප්‍රහාර එල්ල කිරීමත් බලාපොරොත්තු වේ. එකී අරමුණු හා අපේක්ෂා සාක්ෂාත් කරගනු වස් පාද මුර සංචාරය (Foot Patrols), ජංගම මුර සංචාරය (Mobile Patrol),සන්නාහ සන්නද්ධ මුර සංචාරය (Armoured car patrol), හෙලිකොප්ටර මුර සංචාරය (Heli Patrol), විමර්ශන මුර සංචාරය (Investigation Patrol), නිත්‍ය මුර සංචාරය (Standing Patrol) හා ප්‍රහාරක මුර සංචාරය (Fighting Patrol) යන මුර සංචාර ක්‍රියාත්මක වේ. මේ මුර සංචාරයන් මිලිටරි උපක්‍රමවලදී උප අනු ඒකකයක් හෝ කුඩා උපාය මාර්ගික සැකැස්මක් වශයෙන් දැක්විය හැකිය. විශේෂයෙන් ජ.වි.පෙ. වැනි සංවිධානයක් මර්දනය කිරීමෙහිලා මිලිටරි නොවන නීතිය බලාත්මක කිරීම මෙමගින් සිදුවිය. ඒ යටතේ මුර සංචාරයේ යෙදෙන නිලධාරීන්ට ජ.වි.පෙ. ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ වගකීම පවරා තිබුණේය ඔවුන්ගේ රාජකාරී සේවාව අතරට සේවා සඳහා කෙරෙන ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීමට අමතරව අවශ්‍ය වූ විටෙක අත්අඩංගුවට ගැනීම් සිදුකිරීම, ජ.වි.පෙ. විසින් සිදුකරන ලද ක්‍රියාන්විතයන් පිළිබඳව වාර්තා ගැනීම සහ එවැනි ක්‍රියාන්විතයන් නැතිනම් ක්‍රියාකාරකම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම ද ඇතුලත් වී තිබුණි.

සැඟවී සිට පහර දීම (Ambush) සඳහා ස්ථානගත වූ පසු රැකිය යුතු ඉහළම විනය වන සෙලවීමෙන් හෝ ශබ්ද නැගීමෙන් තොරව සිටිමින් විශ්මයජනක හා වේගවත් (Surprise and Speed) ප්‍රහාරයන් තුන් ආකාරයකින් ජ.වි.පෙ. ට එරෙහිව ආරක්ෂක හමුදා විසින් දියත් කරනු ලැබිය. ඒවා ක්ෂණිකව රැක සිට පහර දීම් (Hasty Ambush)**,** සූදානම් සහගතව හෝ සැලසුම්ගතව රැක සිට පහර දීම් (Deliberate Ambush) හා දුරස්ථපලක සිට පහර දීම (Remort Control Ambush) යනුවෙන් දැක්විය හැකිය. මෙම සැඟවී සිට කරනු ලැබූ පහරදීම් ඉලක්කගත ජ.වි.පෙ. සංවිධාන ජාලය විනාශ වී කුඩුපට්ටම් වී යන ලෙසත් කිසිඳු සාමාජිකයකුට බේරී පැන ගත නොහැකි අන්දමින් සියලුදෙනා විනාශ කර දැමිය යුතුය යන තැනක පිහිටා ක්‍රියාත්මක කළේය. මෙහිදී මිනිස්කම මොනම හේතුවක් නිසාවත් සැලකිල්ලට ගනු නොලැබීය.

ජ.වි.පෙ. මර්දනයේ දී වටලා පරීක්ෂා කිරීම් (Cordan and Serch) වලට ප්‍රධාන තැනක් හිමිවිය. එකී වටලා කරනු ලබන පරීක්ෂා කිරීම් ද සූදානම් කරන ලද පරීක්ෂා කිරීම්, හදිසි පරීක්ෂා කිරීම් හා නගර හා මහජනයා ගැවසෙන පොළවල් වැනි ස්ථානවල කරන පරීක්ෂා කිරීම් යනුවෙන් තුන් ආකාරයක් ගනු ලැබුවේය.

සෝදිසි කිරීම් හා විනාශ කිරීම් (Serch and Clear) බොහෝ විට ජ.වි.පෙ. සන්නද්ධ අරගලකරුවන් සිටිනවා යැයි සැක කරනු ලබන ස්ථාන සහිත ප්‍රදේශවල දී මේ ක්‍රියාමාර්ගය අනුගමනය කළේය.

මෙමගින් අරගලකරුවන් ගැවසෙන ස්ථාන සොයා ගැනීමත්, ඔවුන් හඳුනා ගැනීමත්, පලවා හැරීම හෝ විනාශ කිරීමත් සිදු කරන ලදි. එහෙත් නිශ්චිත ඔත්තුවක් මගින් තොරතුරු ලැබී තිබේ නම් තෝරා බේරා විනාශ කිරීමේ ක්‍රියාන්විතයන් ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍යය කොට සලකන ලදි.

මීට අතිරේකව ප්‍රහාරය හා විනාශය (Attack and Destroy) යන මර්දන මූලධර්මය යටතේ සතුරු මූලස්ථාන හා කඳවුරු විනාශ කරලීම සඳහා මෙය අනුගමනය කරමින් නොනැවති කා වැදීම (Penetration) නම් වූ මර්දන ක්‍රියාමාර්ගය උපයෝගී කර ගනිමින් ජ.වි.පෙ. ක්‍රියාධරයන් රැස්ව සිටි ස්ථාන කරා හදිසියේ වේගවත් ලෙස කා වදිමින් කිසිදු ඉස්පාසුවක් හෝ ආරක්ෂා වීමට කිසිදු ඉඩ ප්‍රස්ථාවක් ලබා නොදීමෙන් ජ.වි.පෙ. ඉදිරි වැඩපිළිවෙල හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම මුළුමනින්ම පාහේ වළකාලනු ලැබුවේය.

එසේම සම්පූර්ණයෙන් වට කිරීම. (Envilipment) යන හමුදා ක්‍රියාන්විතයන් මගින් ජ.වි.පෙ. සාමාජිකයින් සිටින ප්‍රදේශයන් තැන් තැන්වලින් වටේට කොටු කර එක් පැත්තකින් පහර එල්ල කිරීම සිදු කරමින් විශාල විනාශයක් සිදුකරනු ලැබු අතර කොටුකිරීම (Encirclement) යටතේ ජ.වි.පෙ. කණ්ඩායම් සිටින බවට විවිධ ප්‍රදේශවලින් ලැබෙන තොරතුරු මත වටකිරීම් සිදුකර විශාල පිරිසක් සැකකරුවන් ලෙස කොටුකර අත්අඩංගුවට ගනු ලැබීය. මෙවන් අවස්ථාවලදී පීරීම් (Swecping Operation) සිදු කිරීම ඔස්සේ ජ.වි.පෙ. සාමාජිකයින් පමණක් නොව ඔවුන්ට විවිධ අයුරින් උදව් උපකාර කළ පිරිස් පවා පීරා ගෙන ගොස් අත්අඩංගුවට ගෙන විනාශ කර දමා තිබුණේය.

තවදුරටත් ජ.වි.පෙ. මර්දනය සඳහා යොදාගත් හමුදා ක්‍රියාමාර්ග යටතේ පැහැර ගැනීම් හා කැරැළිකරුවන් අතරට රිංගීමට අමතරව විශේෂිත ක්‍රියාමාර්ග ද අනුගමනය කරන ලද්දේය. මේ යටතේ දුෂ්කර ඝන වනාන්තරවල පදනමක් සහිත ගම් හා නගරවල සිටින

අරගලකරුවන්ට මුහුණ දීම සඳහා විශේෂයෙන් පුහුණු කළ කුඩා හමුදා කණ්ඩායම් යොදා ගත් අතර මේ කණ්ඩායම්වලට ආරක්‍ෂක හමුදාවන්ට සම්බන්ධ නොවූ පිටස්තර පුද්ගලයින් ද සම්බන්ධ කර ගෙන තිබුනේය.

### *මානසික යුධ උපක්‍රම (Psychological Warfare)*

විශේෂයෙන් විප්ලවීය ව්‍යාපාරයක් සමඟ ගෙන යන යුද්ධයේ දී මානසික යුධ උපක්‍රමවලට විශේෂ තැනක් හිමි වේ. පවතින දේශපාලන වාතාවරණය ප්‍රයෝජනයට ගනිමින් දැඩි අධිෂ්ඨානයකින්, ජීවගුණයකින්, කැපවීමකින්, හා සවිඥානකත්වයකින් යුක්ත නිර්භීතභාවයකින් සපිරුණු වීරත්වයෙන් පිරි ගෙරිල්ලා හමුදාවක් පරාජයට පත්කිරීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. මරණය පිළිබඳව කිසිදු තැකීමක් නොකර විප්ලවීය භටයන් ශාරීරික වධ හිංසා මගින් හෝ මරා දැමීම මඟින් විනාශ කළ නොහැකි බව ඔව්හු අත්දැකීමෙන්ම දනිති.

අනෙක් අතට මර්දනය යන්න හොඳ අවියක් නොවන බවත්, ඒ තුළින් විප්ලවීය ව්‍යාපාර වර්ධනය වන බවත්, ඉන් එය ජනතා සහාය නොමඳව ලබන බවත්, ඔවුන් අත්දැකීම් තුළින් තේරුම් ගත්හ. මේ අනුව විප්ලවීය ව්‍යාපාරයක ශක්තිය බිඳ හෙළීම සඳහා සුදුසු සටන් ක්‍රමයක් වශයෙන් මානසික යුධ උපක්‍රම බිහි විය. සෑම යුද්ධයකදීම පාහේ මානසික යුධ උපක්‍රමවලට වැදගත් තැනක් හිමි වුව ද ගෙරිල්ලා යුද්ධයකට එරෙහිව ගන්නා මානසික යුධ උපක්‍රම විශේෂ තැනක් හිමි කර ගනී. මලයාසියාවේ කොමියුනිස්ට් පක්ෂය විනාශ කරලීමට මානසික යුධ උපක්‍රම යොදා ගැනීම මඟින් විප්ලවවාදී ව්‍යාපාරයන්ට විරුද්ධව යුද්ධයේ දී මෙය ජනප්‍රිය අංගයක් බවට පත් වී ඇත. පසුගිය කාල වකවානුව මුළුල්ලේම ගෙරිල්ලා හමුදාවන් සමඟ සටන් වැදීමේ දී ලද අත්දැකීම්වලින් අද මානසික යුධ උපක්‍රම පෙර නොවූ විරූ ආකාරයෙන් සංවර්ධනය වී ඇත. ඒ සඳහා විවිධ රටවල යුධ විශේෂඥවරයන්ගේ මැදිහත් වීමෙන් විවිධ පාඨමාලා හඳුන්වා දී තිබේ. විශේෂයෙන් ලෝකයේ බලවත්ම ඔත්තු සේවයක් වන ඊශ්‍රායල් රාජ්‍යයේ 'මොසාඩ්' ඔත්තු සේවය විසින් මානසික යුධ උපක්‍රමවලට විශේෂ තැනක් හිමි කර දී ඇත. මේ ආකාර වූ මානසික යුධ උපක්‍රම ''ජනතාව අතර පදනම දුර්වල කිරීම'' හා ''විශ්වාසය බිඳ දැමීම් නොහොත් ජීවගුණය මොටකිරීමේ'' ප්‍රධාන අරමුණු දෙකක් (02) ඔස්සේ ක්‍රියාත්මක වන බව පෙනේ. මේ තුළ මානසික යුධ උපක්‍රම ප්‍රධාන පාර්ශ්වයන් දෙකක් හා ප්‍රධාන ක්‍රියාමාර්ග දෙකක් ඔස්සේ විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව තවදුරටත් ක්‍රියාත්මක වන බව කිව යුතු ය.

***ජනතාව අතර පදනම දූර්වල කිරීම.***

ගෙරිල්ලා ව්‍යාපාරයක සාර්ථකත්වයේ එක් එක් පියවර සේම සමස්ත ව්‍යාපාරයේ ම සාර්ථකත්වය රඳා පවත්නා වූ පදනම වනුයේ මහජනතාව ය. මේ සඳහා ජලය හා මාළුවා අතර ඇති සම්බන්ධය ජනප්‍රිය උදාහරණයක් වශයෙන් යොදා ගැනේ. එම සම්බන්ධතාවය බිඳ දැමීම සඳහා විවිධ උපක්‍රමයන් අනුගමනය කිරීම මෙහි දී කරනු ලැබේ.

***විශ්වාසය බිඳ දැමීම.***

ගෙරිල්ලා ව්‍යාපාරයක් සාර්ථකව පවත්වා ගෙන යාමේ අනෙක් ප්‍රධාන පදනම වනුයේ විශ්වාසය යි. එය වූ කලී සමස්ත ව්‍යාපාරයේම අරමුණු කෙරෙහිත්, නායකත්වය කෙරෙහිත් පවතින්නා වූ අචල විශ්වාසයයි. එකී විශ්වාසයන්ගේ පැවැත්මට ආදරය හා ගෞරවය නිතැතින්ම අවශ්‍ය වේ. මෙපරිද්දෙන් වූ උත්තරීතර විශ්වාසය යන්න දූර්වල කිරීම සඳහා විවිධ උපක්‍රම අනුගමනය කිරීම මෙහිදී සිදු කරනු ලබයි.

***මානසික යුධ උපක්‍රමවල පාර්ශ්වයන්***

මානසික යුධ උපක්‍රමවල ප්‍රධාන පාර්ශ්වයන් දෙකක් දක්නට ලැබේ. එනම්,

i. දිනා ගැනීම් මගින් ව්‍යාපාරය දූර්වල කිරීම සහ

ii. ප්‍රහාරය මගින් ව්‍යාපාරය දූර්වල කිරීම යනුවෙනි.

මේ අනුව මෙහි දිනා ගැනීමේ උපක්‍රමය සහ ප්‍රහාරක උපක්‍රමය ද අන්තර්ගත වන බව කිව යුතු ය.

***ක්‍රියාමාර්ග***

විප්ලවවාදී ව්‍යාපාරයකට එරෙහිව ධනේශ්වර හමුදා විසින් යොදා ගන්නා මානසික යුධ උපක්‍රම ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එනම්, ජනතාවට එරෙහිව ක්‍රියාත්මක කරනු ලබන මානසික යුධ උපක්‍රම හා විප්ලවීය ව්‍යාපාරයට එරෙහිව ගෙන යන මානසික යුධ උපක්‍රම වශයෙනි.

***ජනතාවට එරෙහි මානසික යුධ උපක්‍රම***

මෙහිදී ජනතාවට එරෙහිව ක්‍රියාත්මක කරන්නා වූ මානසික යුධ උපක්‍රම මඟින් මූලික වශයෙන් ධනේශ්වර හමුදාවක් බලාපොරොත්තු වන්නේ ජනතාව හා විප්ලවීය ව්‍යාපාරය අතර පවත්නා උස් මානුෂීය සමාජීය සම්බන්ධතාවය බිඳ දමා එකී ව්‍යාපාරය මුළුමනින්ම හුදෙකලා කිරීම වේ. ඒ සඳහා දිනාගැනීම, කළකිරවීම, ජනතාව දුර්වල කිරීම හා භීෂණය යන මානසික යුධ උපක්‍රමයන් බෙහෙවින් උපයෝගී කර ගනු ලැබේ.

**i. දිනා ගැනීම.**

ධනේශ්වර හමුදාව විසින් විප්ලවවාදී ව්‍යාපාරයට එරෙහිව සාමාන්‍ය ජනතාව තමන් වෙත දිනා ගැනීම උදෙසා ජනතාව අතර සුහදතාවය හා මිත්‍රත්වය වර්ධනය කරලීමට ක්‍රියාමාර්ග ගනු ලබයි. ඔවුනට විවිධ සේවාවන් හා පහසුකම් සලසාදීම, බෙහෙත් ද්‍රව්‍ය ලබා දීම, පාලම් ඉදිකිරීම, බෝක්කු තැනීම, මාර්ග තැනීම හා මාර්ග හා බෝක්කු, පාලම් අලුත්වැඩියා කිරීම් හා ප්‍රදේශවාසීන් සමග ශ්‍රමදාන, ක්‍රීඩා උත්සව ආදී පොදු සාමූහික ක්‍රියාමාර්ගවලට සම්බන්ධ වේ.

එමෙන්ම හැමවිටම පාහේ ඔවුන්ගේ ආචාරශීලීබව, ගුණගරුකබව හා යුක්තිගරුකබව පෙන්වීමට උත්සාහ ගනී. සාමාන්‍යයෙන් මෙවැනි හමුදාවක් විසින් කරනු ලබන සොරකම් හා ස්ත්‍රී දූෂණයන්ගෙන් වැළකී ජනතාවගේ ආරක්ෂකයින් ලෙස ක්‍රියාකිරීමට ඉදිරිපත් වේ.

**ii. කළකිරවීම.**

සාමාන්‍ය ජනතාව විප්ලවීය ව්‍යාපාරය කෙරෙහි කළකිරවීම සඳහා හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම හැමවිටම ගැනීමට උත්සුක වේ. ඒ සඳහා ප්‍රචාරක ව්‍යාපාරයන් හා ප්‍රති ප්‍රචාරයන් (Counter Propaganda) මඟින් අවලාද, අපහාස, බොරු විකෘති කිරීම් පතුරුවාලීමට කටයුතු කරයි. මීට අමතරව විවිධ මතවාද ගෙනයෑම, විවිධ වැරදි විප්ලවීය ව්‍යාපාරය මත පැටවීමට උත්සාහ කිරීම, ජනතාවට දුෂ්කරතා හා පීඩනයන්ට මුහුණ දීමට සිදු වී තිබෙන්නේ විප්ලවීය ව්‍යාපාරය නිසා බව පෙන්වා තහවුරු කිරීම, නායකත්වයේ දුර්වලතාව පෙන්නුම් කිරීම, නායකත්වයට ප්‍රහාර එල්ල කිරීම හා න්‍යායික වැරදි ආදිය පෙන්නුම් කිරීමට නිරතුරුවම ක්‍රියාකරනු ලැබේ.

### iii. ජනතාව දුර්වල කිරීම.

ජනතාව විප්ලවීය ක්‍රියාමාර්ගවලට නැඹුරුවීමට ඇති තත්ත්වයන් වළක්වා ඔවුන්ගේ පක්ෂපාතීත්වයන් දිය කර හැරීමට ක්‍රියාමාර්ග ගැනීම මෙමගින් බලාපොරොත්තු වේ. මානසික යුධ උපක්‍රමයන් වශයෙන් හමුදාවේ දැවැන්ත යුධ ශක්තිය පෙන්වීම සඳහා සන්නාහ සන්නද්ධ යුධ රථ ප්‍රදර්ශනය (Armoured Car Partol) කිරීම හා නවීන අවි ආයුධ ප්‍රදර්ශනය කිරීම මගින් විශාල වෙඩි බලයක් නිකුත් කිරීමට හැකි හමුදාවක් සමග සටන් කර කිසිදා විප්ලවිය හමුදාවකට ජයගත නොහැකි බව එත්තු ගැන්වීමට උත්සාහ කරයි. අනෙක් අතින් විප්ලවීය ව්‍යාපාරය සතු ගල්කටස් වැනි ආයුධවල නොදියුණු තත්ත්වය විස්තර කරමින් යුධමය අතින් ධනේශ්වර හමුදාවට වඩා ගව් ගණනක් පිටුපසින් ඔවුන් සිටින බව පෙන්වා දීමෙන් නොනැවතී සංස්කෘතික පදනමක් ඇති රටක කිසිදා ලේ හැලුණු විප්ලවයක් කර ජයග්‍රහණය කළ නොහැකි බවත් සිංහල මිනිසුන්ගේ හැටියට මෙවැනි දේ කිසිසේත් අගයන්නේ නොමැති බවද අවධාරණය කිරීමට වගබලා ගනු ලැබේ.

### iv. භීෂණය

විප්ලවීය ව්‍යාපාරයට එරෙහිව යථෝක්තව දක්වනු ලැබූ මානසික යුධ උපක්‍රම ක්‍රියාමාර්ගයන් සාර්ථක නොවන කල්හී භීෂණය යොදා පොදු ජනතාව ඉමහත් භීතියකට හා ත්‍රාසයකට පත්කොට එම ව්‍යාපාරය කෙරෙන් ඈත් කර වීම ත්, දුර්වල කිරීම ත් මෙමගින් සිදුවේ. මේ සඳහා හමුදා විසින් උපයෝගී කර ගනු ලබන්නේ ත්‍රස්ත උපක්‍රමය. (Terror Tactics) එනම් මරා පුළුස්සා දැමීම, අතපය කඩා ගලවා දැමීම, ඇස් උගුල්ලා දැමීම වැනි භයානක මාර වධයන් ප්‍රසිද්ධියේ පැමිණවීම. මිනී කඳු ගොඩගැසීම, ස්ත්‍රී දූෂණය වැනි ම්ලේච්ඡ ක්‍රියාමාර්ගවලින් භීෂණය උත්සන්න කරනු ලැබේ. මේ ධවල භීෂණය දකින හා අසන ජනතාව තුළ විශාල කම්පනයක්, අන්දමන්ද වීමක් හා අවිනිශ්චිතභාවයක් ඇතිවී විප්ලවීය ව්‍යාපාරයට මසැසින් පමණක් නොව මනසින් ද උදව් නොකරන තත්ත්වයකට පත් වේ.

මේ හැර විප්ලවීය ක්‍රියාමාර්ගවලට සමාන්තර ක්‍රියාමාර්ග ධනේශ්වර හමුදාව විසින් අනුගමනය කිරීමෙන් ජනතාව වික්ෂිප්ත කරලීමට ද, කටයුතු කරනු ලැබේ. උදාහරණයක් වශයෙන් ජ.වි.පෙ. ලෙස පෙනී සිටිමින් නිවෙස්වලට ගොස් පුහුණුවට බව පවසා තරුණ තරුණියන් ගෙන ගොස් දරුණු වධ බන්ධන පමුණුවා අග පසග ඡේදනය කොට මහමග මරා දැමීම, පෝස්ටර් ඇලවීමට කියා ගෙන ගොස් මරා දැමීම, සහාය ඉල්ලා ගෙවල්වලට යෑම, විශේෂයෙන් තරුණියන් ගෙනගොස් දූෂණය කොට මරා දැමීම යන මේ ක්‍රියාමාර්ග මගින් තෝරා බේරා ගැනීම් අපහසු කරවා ඒ තුළින් විප්ලවීය ක්‍රියාකාරීත්වය දුර්වල කිරීම

සිදුකරන ලදි. තවද, විවිධ අන්දමේ තර්ජනය කිරීම්වලින් ජනතා ක්‍රියාකාරීත්වය සීමා කිරීමට කටයුතු කරනු ලැබේ. සමහර හමුදා කඳවුරු අවට නිවෙස්වලට ගොස් විප්ලවවාදින්ගෙන් යම් ප්‍රහාරයක් එල්ල වුවහොත් ගේ - දොර, වතුපිටි පමණක් නොව ජීවිත ද විනාශ කරන බවට තර්ජනය කරනු ලබයි. මේ මඟින් ව්‍යාපාරය සමග සිටින අය එය අතහැර යාමට සැලැස්වීමත්, අලුතින් එකතු වීම නවතා දැමීම හා සහාය දීම් වළක්වාලීමට අදහස් කළ බව පෙනේ. (වන්නිආරච්චි, සම්මුක සාකච්ඡාව, 2014.04.30)

***ජනතා විමුක්ති පෙරමුණේ විප්ලවීය ව්‍යාපාරයට එරෙහි මානසික යුධ උපක්‍රම***

ධනේශ්වර හමුදාව විසින් විප්ලවීය ව්‍යාපාරයට එදිරිව දියත් කරන්නා වූ මානසික උපක්‍රමයන් දිනා ගැනීම, දුර්වල කිරීම, භීෂණය, ප්‍රතිප්‍රචාරක කටයුතු, සන්නද්ධ ක්‍රියාමාර්ග, කලකිරවීම හා පුනරුත්ථාපනය යන ක්‍රියාමාර්ගයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ආකාරය දැකිය හැකි ය. මෙහි දී මූලික වශයෙන් අපේක්ෂා කරනුයේ විප්ලවවාදීන් හා විප්ලවීය ව්‍යාපාරය අතර තිබෙන්නා වූ විප්ලවීය සදාචාරාත්මක හා සහෝදරාත්මක බැඳීම මුළුමනින්ම සුණු විසුණු කොට හුදෙකලා පුද්ගලයෙකු බවට පත් කොට එකී ව්‍යාපාරය විනාශ කොට දැමීම වේ. එම මානසික උපක්‍රමයන් කරුණු කාරණා වශයෙන් මෙසේ පෙළ ගැස්විය හැකි වේ.

දිනා ගැනීම. (Winning) යන මානසික උපක්‍රමය යටතේ විප්ලවීය ව්‍යාපාරයට සම්බන්ධ වී සිටි පුද්ගලයන් මරණ භය ඇති කිරීම මඟින් දිනා ගැනීමට කටයුතු කළ අතර එහි නායකයන්, ප්‍රතිපත්ති හා වැඩපිළිවෙල පිළිබඳ විශ්වාසය බිඳ දමමින් නොයෙක් ආකාරයේ බොරු බේගල් ප්‍රබන්ධනාත්මකව ඉදිරිපත් කර නොමග යවමින් ඔවුනට අනෙක් අයට නොමැති පහසුකම් සපයමින්, ලෙන්ගතු වදන් මාලාවකින් ආමන්ත්‍රණය කර ආරක්ෂක හමුදාවේ මිතුරන් හා සගයින් ලෙස දිනාගනු ලැබීය. මෙලෙස දිනාගත නොහැකි වූ තවත් අයවලුන් අල්ලස් දීම් මගින් ද දිනා ගැනීමට කටයුතු කර තිබුණේය. (සමන්කුමාර, මච්මිබ, 2019.11.22)

දුර්වල කිරීම. (Weakening) නම් මානසික උපක්‍රමය මගින් අත්අඩංගුවට පත් සාමාජිකයින් තුළ මරණ භය ඇති කිරීම තුළින් මෙන්ම ඉහත කී විශ්වාසය බිඳ දැමීම, නොමග යැවීම හා මිතුරන් හා සගයින් මෙන් ක්‍රියාකිරීම හරහාත් දරුණු වධදීම් සහ කාන්තා සාමාජිකාවන් නිරුවත් කිරීම මගින් භය ලැජ්ජාව ඇති කර මානසික වශයෙන් බිඳ වැටුණු පුද්ගලයන් බවට පත් කරනු ලැබීය. මීට අමතරව නිරන්තර නින්දා අපහාස කිරීම්වලට ලක් කරමින් නොනැවතී අනෙක් අයගේ බිඳවැටීම් මඟින් එනම් මුහුණ ආවරණය කරගත් ඔත්තුකරුවන් හෙවත් 'බිල්ලන්' බවට පත් කර ගත් පුද්ගලයන් විසින් විප්ලවවාදී ව්‍යාපාරයට

එරෙහිව ඉතා පහත් හා නින්දිත අයුරින් ක්‍රියාත්මක වන ආකාරය පෙන්වාදීම තුළින් ජ.වි.පෙ. දැඩි ස්ථාවරයක පිහිටා කටයුතු කරමින් සිටි අයවලුන් දුර්වල කටයුතු කරන ලදි. එසේම ආරක්ෂක හමුදා ශක්තිය හුවා දක්වමින් නොදියුණු අවිවලින් සන්නද්ධ වූ ජ.වි.පෙ. ට රජය සමග සටන් කළ නොහැකි බව පෙන්වා දෙමින් සහ අත්අඩංගුවට පත් අය පිළිබඳව සියළුම දේ දන්නා බව පෙන්වීමෙන් ඔවුන් තවදුරටත් සාර්ථකව දුර්වල කිරීම කරනු ලැබුවේය.

ජවිපෙ මර්දනය කිරීමේ ප්‍රබලතම මානසික උපක්‍රමයක් ලෙස භීෂණය (Management Terror) යොදාගනු ලැබුවේය. මේ ත්‍රස්ත උපක්‍රමය (Terror Tactics) භාවිතා කිරීමෙන් ව්‍යාපාරය විශාල කම්පනයකට සහ අවුල්සහගත භාවයකට පත්කිරීමට වගබලා ගැනීමත් සමග විශාල වශයෙන් සාමාජික පිරිස් හා හිතවතුන් ව්‍යාපාරය අත්හැරයාමට සැලැස් වූවා සේම අලුතින් සාමාජිකයින් එකතුවීම හා අලුතින් සහයෝගය ලබාදීම මුළුමනින්ම පාහේ වැළකී ගියේය. උදාහරණයක් වශයෙන් ඊශ්‍රායලයේ මානසික යුධ උපක්‍රම විශේෂඥයින් විසින් තණමල්විල ප්‍රදේශයේදී විශේෂ පුහුණුවක් ලබා දී තිබූ ක්ෂණික විහිදුම් බලකායේ (R.D.F.) නිලධාරීන් යොදාගෙන තෝරාගත් ප්‍රදේශවල ඇති මිනී කනත්තවල හෙවත් මිනී පිටිවලට ගොස් අලුත වැළලූ මිනී ගොඩ දමනු ලැබීය. එක් වතාවකට මේ මිනී කණ්ඩායම් විසින් මල මිනි 20 - 25 ක ප්‍රමාණයක් දිනකට ගොඩ දමනු ලැබීය. අනතුරුව ඒවා තෝරා ගත් විවිධ ස්ථානවලට ගෙන ගොස් දර හා ටයර් දමා පුළුස්සා දමනු ලැබීය. මේ රාත්‍රී මෙහෙයුම් ජවිපෙ ට මෙන්ම පොලීසියට දැනගත නොහැකි අන්දමින් ඉතා ප්‍රවේශමෙන් සිදු කරන ලද්දේය. මේ අන්දමින් මරා පුළුස්සන ලද මළ සිරුරු පිළිබඳව පුවත්පත් වාර්තා පිරෙන්නට විය. ඒ තුළ ජ.වි.පෙ. සාමාජිකයින්ගේ ඉරණම මේ යැයි තැති ගැන්මක් මුළු දිවයින පුරාම නිර්මාණය වන්නට විය. මේ සමගම ටයර් සංස්කෘතියේ ආරම්භය සිදුවී මෙතෙක් රහසින් මරණයට පත් කළ සියල්ලෝම එළිපිට මරා දමා රටපුරාම භීෂණය ඇති කළේය. (වීරක්කොඩි, සත්හඬ, 2016.10.16)

ප්‍රති ප්‍රචාරක වැඩපිළිවෙල (Counter Propaganda) ද ජවිපෙ මර්දනය කිරීම සඳහා ආරක්ෂක හමුදා විසින් ඉහළින්ම යොදාගනු ලැබීය. ඒ සඳහා සිංහල මාධ්‍ය ප්‍රචාරක ව්‍යාපාරයක් අරඹමින් එය දිගින් දිගටම පවත්වා ගෙන යාම මඟින් ජ.වි.පෙ. සාමාජිකයින් හා හිතවතුන් තුළ දීර්ඝකාලීන මානසික කම්පනයක් ඇති කරනු ලැබුවේය. මේ සඳහා ඒකාබද්ධ හමුදා මෙහෙයුම් මූලස්ථානයය තුළ ජනමාධ්‍ය මධ්‍යස්ථානයක් පවත්වා ගෙන ගියා පමණක් නොව 'නිදහස් හඬ' නමින් ප්‍රචාරක පෝස්ටර් ද මෙහි නිර්මාණයක් ලෙස එළි දුටුවේය. මෙම මර්දනීය මානසික උපක්‍රමයන්ට සමගාමීව සන්නද්ධ ක්‍රියාමාර්ගයන් o

(Armed Propaganda) දිගින් දිගටම අනුගමනය කරනු ලැබුවේය. ජ.වි.පෙ.ට කිසිඳු ඉස්පාසුවක් නොදී ක්‍රියාත්මක කරන ලද සන්නද්ධ ක්‍රියාමාර්ගවලින් ඔවුන් හෙම්බත් කර වීම රජයේ ආරක්ෂක හමුදාවල ප්‍රධාන උපාය මාර්ගයක් වී තිබුනේය. ඒ මඟින් ජ.වි.පෙ. තුළ පරාජිත හා ආරක්ෂාකාරී මානසිකත්වයක් ඇති කිරීමට ආරක්ෂක හමුදාවෝ සමත් වී සිටියහ.

කළකිරවීම (Disappointment) නම් වූ මානසික උපක්‍රමය ද ජ.වි.පෙ. වැනසීම සඳහා සාර්ථකව භාවිතා කළ ආරක්ෂක අංශ විසින් ජ.වි.පෙ. වටා රොක්ව සිටි පුද්ගලයාගෙන් පුද්ගලයාට අවිශ්වාසය හා සැකය ඇති කර වීම තුළින් කලකිර වීම නමැති වෛරසය ජ.වි.පෙ. පුරා පැතිරවීමට කටයුතු කර තිබුණේය. විශේෂයෙන් නායකත්වය කෙරෙහි කලකිරවීම් ඇති කරමින් බිඳ වැටීම් සිදුකර ජ.වි.පෙ. විසින් ගෙනගිය ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක සන්නද්ධ ක්‍රියා මාර්ගවලින් අහිංසක මිනිසුන් මරා දමන බව සහ හමුදා පවුල් මරණ බවට පුළුල් ප්‍රචාරයක් ලබා දීමෙන් විශාල කලකිරවීමක් ජ.වි.පෙ. කෙරෙහි සාමාන්‍ය ජනතාව තුළ ඇති කරවීමට කටයුතු කර තිබුණේය. ඉන් නොනැවතී ජ.වි.පෙ. න්‍යායික පිළිගැනීම් පිළිබඳව ද, ලෝකයේ බොහෝ සමාජවාදී රටවල සිදුවන දේවල් පිළිබඳව ද ජ.වි.පෙ. පිළිගෙන තිබු මාක්ස්වාදී දර්ශනයේ අඩුපාඩු ගැන ද නොයෙක් ආකාරයේ දේශන පවත්වා කලකිරවීම් ඇති කිරීම ජ.වි.පෙ. මර්දනයට බෙහෙවින්ම බලපා තිබූ බව පෙනේ. අවසාන වශයෙන් පුනරුත්ථාපනය (Rehabilitation) නම් වූ මානසික යුධ උපක්‍රමය ඉවහල් කර ගනිමින් ජ.වි.පෙ. සාමාජිකයන්ගේ විප්ලවවාදී ජීවගුණයන් මොට කිරීමෙන් සහ මානසික වැහැරීම් ඇති කර ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ගවලට යොමු කිරීමට ආරක්ෂක හමුදා සමත් වී තිබුනේය. (සම්මුඛ සාකච්ඡාව, අමරසිංහ, 2014.04.18)

### *අභ්‍යන්තර ආරක්ෂක ක්‍රම (Internal Security)*

පවතින ධනේශ්වර දුර්දාන්ත ආණ්ඩුවකට එරෙහිව රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා විප්ලවවාදී ව්‍යාපාරයක් දේශපාලන හා යුධමය වශයෙන් ක්‍රියාත්මක වනවිට රටේ අභ්‍යන්තර ආරක්ෂාව සඳහා යොදා ගන්නා ක්‍රියාමාර්ග මෙයට අයත් වේ. රටේ ඇතිවන කැළඹිලි, කැරළි, උද්ඝෝෂණ ව්‍යාපාර, වැඩ වර්ජන, පෙළපාලි යැම් වැනි ක්‍රියාමාර්ගවලට එරෙහිව මෙම උපක්‍රම නිරතුරුවම ක්‍රියාත්මක වේ. මේවා ක්‍රියාත්මක කළ යුත්තේ අවම බලය යෙදවීමේ මූලධර්මය මත වුව ද ධනේශ්වර ආණ්ඩු හා ඒ යටතේ ක්‍රියාත්මක වන්නා වූ හමුදාව සහ පොලීසිය නෛතික හා ආචාරධාර්මික සීමාවන් ඉක්මවා ඕනෑම මොහොතක විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව ක්‍රියාත්මක කිරීමට පසුබට නොවේ. එකී ක්‍රියාමාර්ගවලට උදාහරණ වශයෙන් මාර්ග බාධක පැනවීම. (Road blocks), පරීක්ෂා කිරීම්

(Check point), පහරදිය හැකි නැතිනම් අනතුරට භාජනය විය හැකි ස්ථාන ආරක්‍ෂා කිරීම. (Vulnerable Points guard), මර්මස්ථාන ආරක්‍ෂාව (Key points guard), වැදගත් පුද්ගලයින් ආරක්‍ෂා කිරීම. (Very important Persons Guard), මුර සංචාරය කිරීම් (Patrols), හා කැරැළි මර්දන ක්‍රියාමාර්ග (Riot Suppression Measures) ගණයෙහිලා සැලකෙන කඳුළු ගෑස්, බැටන් චාජ්, වෙඩි තැබීම් හා විසුරුවා හැරීම් සිදු කිරීම් දැක්විය හැකිය. (ද සිල්වා, 1988-1989, ප්‍රමුදිත සටහන්)

**නිගමනය**

මෙම අධ්‍යයනය මගින් 1986-89 ජනතා විමුක්ති පෙරමුණේ සන්නද්ධ සටන් ව්‍යාපාරය හා සමාජ විප්ලවය මර්දනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එවකට පැවති ආණ්ඩුව තම හමුදාව මෙහෙය වූ අන්දම අපගේ අධ්‍යයනයට ලක්විය. ශ්‍රී ලංකාවේ නිදහසින් පසු ඇති වූ ජනතා විමුක්ති පෙරමුණේ තරුණ නැගිටීම් හා විමුක්ති සටන් ව්‍යාපාර දෙකම පැවති රජය විසින් දැඩිව මර්දනය කරන ලදී. දෙවන සන්නද්ධ අරගලයේ දී තම නායකයා ද, උප නායකයා ද ඇතුළුව දේශපාලන මණ්ඩලයේ හා මධ්‍යම කමිටුවේ බොහෝ සාමාජිකයින් ජනතා විමුක්ති පෙරමුණට අහිමි විය. මෙවන් කෲර මර්දනයක් සඳහා යොදාගත් හමුදා යාන්ත්‍රණය හා එහි උපක්‍රම හඳුනාගැනීම ඉතා වැදගත් ය. ඉතිහාසයේ අදාළ සිදුවීම කෙසේවී ද යන මානව අත්දැකීම් වටහා ගැනීමට මෙම යාන්ත්‍රණය හඳුනාගැනීම අවශ්‍ය වේ. මෙම අධ්‍යයනයේ දී ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කිරීම සඳහා යොදාගත් යුද උපක්‍රම ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ අපගේ විග්‍රහයට ලක්විය. ඉදිරියට යාම, ප්‍රහාර එල්ල කිරීම හා ආරක්ෂාව උදෙසා පසු බැසීම වැනි උපක්‍රම සම්මත යුද උපක්‍රම බවත්, එවන් ක්‍රියාමාර්ග මගින් විමුක්ති ව්‍යාපාරයේ සන්න්ද්ධ අංශයට හානි සිදුකළ බවට මේ අනුව පැහැදිලි වේ. කැරලි කරුවන්ගේ උපක්‍රම හා උපාය මාර්ග හඳුනාගනිමින් කැරලිකරුවන්ගේ විප්ලවයට ප්‍රතිවිප්ලවීය උපක්‍රම මගින් රජයේ හමුදා ක්‍රියාත්මක වූ අන්දම මෙහිදී අපගේ නිරීක්ෂණයට ලක්විය. එමෙන් ම තම සතුරා පරාජයට පත්කිරීම සඳහා මානසික උපක්‍රම යොදමින් හමුදාව විසින් ජනතා විමුක්ති පෙරමුණේ චිත්ත ධෛර්ය හීන කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග ද මෙහිදී විග්‍රහ කර ඇත. යුද්ධය හා යුද හමුදාවට අදාළව බොහෝ න්‍යායාත්මක හා සංග්‍රාමීය දැනුම විසිවන සියවස වන විට වර්ධනය වී තිබුණි. මෙම දැනුම සහිත ආරක්ෂක විද්‍යාවේ බොහෝ ලක්ෂණ ජනතා විමුක්ති පෙරමුණ මර්දනයට එවකට සිටි හමුදාව යොදාගෙන ඇත. නමුත් මනුෂ්‍යත්වයට පවා නිග්‍රහ වන අන්දමින් මානව ජීවිතවල වටිනාකම ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වා තම ප්‍රතිවාදීන් ඝාතනය කිරීම පිළිබඳ කලුපැල්ලම් ද මෙම සටන් ව්‍යාපාරයේ දී ලංකා ඉතිහාසයට එක් වී ඇත. ඉතිහාසය යන විෂය ක්ෂේත්‍රයෙන් අතීතය පිළිබඳ දැනුම නූතන

සමාජයේ පැවැත්මට යොදාගැනීමේ හැකියාව පවතී. අපගේ සාකච්ඡාවට ලක් වූ ජනතා විමුක්ති පෙරමුණේ මර්දනය පිළිබඳ ලාංකේය අත්දැකීම් විමුක්ති සටන් මර්දනයේ ජයග්‍රහණ ගැන ඉතිහාසයට ද සන්නද්ධ ව්‍යාපාර නැවත සැලකිය යුතු තැන් ගැන ඉතිහාසයට ද එකසේ වැදගත් වේ.

කෙසේ නමුත් ජනතා විමුක්ති පෙරමුණේ දෙවන සන්නද්ධ අරගලය මර්දනය කිරීම සඳහා භාවිත හමුදාමය ක්‍රියාමාර්ග පිළිබඳ සිදු කරන ලද මේ විධිමත් විමර්ශනයේ දී ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවලට එකී සන්නද්ධ අරගලය මර්දනය කිරීමෙහිලා කැපී පෙනෙන අංශයක් වශයෙන් ඊශ්‍රායල් හමුදා කටයුතු පිළිබඳ විශේෂඥයින් විසින් ලබා දී තිබූ උපදේශයන් බෙහෙවින් මහෝපකාරී වී තිබූ බව ගම්‍යමාන වේ. මෙම ජ.වි.පෙ. දෙවන සන්නද්ධ අරගලය 1986 - 1987 වකවානුවේ සක්‍රීයව ක්‍රියාත්මක වනවිට එහි පහළ සාමාජිකයින් අත්අඩංගුවට ගත් අවස්ථාවලදී ඔවුන්ගෙන් ප්‍රශ්න කර තොරතුරු ලබා ගැනීමෙන් පසු මරා දමන ලෙස ඊශ්‍රායල් යුධ විශේෂඥයින් විසින් රජයට හා ආරක්ෂක හමුදාවලට උපදෙස් ලබාදී තිබුණේය. එසේම මේ අයුරු එම ක්‍රියාදාමය පියවරෙන් පියවර ඉදිරියට ගෙන ගොස් සීමිත කාලයක් තුළ ජ.වි.පෙ. නායකයන් වෙතට ළඟාවීමේ විවරය තනා ගත හැකි බවට ද ඔවුන් විශ්වාසය පල කරමින් ඝාතනය කළ යුතු ප්‍රමාණයන් පිළිබඳව ද ඉලක්කම් ලැයිස්තු ගත කිරීමට සමත්ව සිටියහ. මේ අයුරු ඝාතනයට ලක් වූ ජ.වි.පෙ. තරුණයින්ගේ මළ සිරුරු මහජනයා ගැවසෙන ප්‍රසිද්ධ මහාමාර්ගයන් හි එළිපිට පුළුස්සා දැමීමෙන් විප්ලවාදීගෙන් සාමාන්‍ය මහජනතාව ඈත් කර තබමින් දෙපිරිස අතර පැහැදිලි බෙදුම් රේඛාවක් නිර්මාණය කිරීම අපේක්ෂා කළ බව පෙනේ. මේ වාතාවරණය තුළ ඊශ්‍රායල් උපාය මාර්ගය මත යැපුණු ආරක්ෂක අංශ සිය ප්‍රථම අදියරේදී අත්අඩංගුවට ගනු ලැබූ ජ.වි.පෙ. නායකයන් යැයි විශ්වාස කළ හා අනුමාන කළ අය මරා දමනු ලැබුවේය. එලෙස ඝාතනයට ලක් වූ පිරිස අතර ජ.වි.පෙ. ඉදිරිපෙළ නායකයන් අතර වූ පරිපාලන ලේකම් තැන්පත් දේශපාලන මණ්ඩල සභික සුමිත් අතුකෝරාළ මෙන්ම නන්දතිලක ගලප්පත්ති, ආර්.බී. විමලරත්න හා ඉන්ද්‍රරත්න හෙවත් පාල යන මධ්‍යම කාරක සභිකයන් ද වූහ. (සමන්කුමාර, මච්චිම, 2019.12.22) මොවුන් වැඩිදෙනෙකු යට කී දැඩි වධබන්ධන පමුණුවාලීමේ උපාය මාර්ගය අනුගමනය කරමින් තිරස්චීන ලෙස මරා දැමුවද ඔවුන් කිසිවකුගෙන් කිසිඳු ආකාරයක තොරතුරු අංශු මාත්‍රයක් දැනගත නොහැකි වූවේය. ඔවුන් නිර්භයව හා එඩිතරව තම විප්ලවවාදී ව්‍යාපාරය පාවාදීමේ මාවතට එරෙහිව මරණයේ මාවත තෝරා ගැනීම කරණ කොටගෙන ඊශ්‍රායල් උපදෙස් මත ජ.වි.පෙ. මර්දන කටයුතු ගෙනගිය විමර්ශන කණ්ඩායම්වලට ඒ ප්‍රාණ පරිත්‍යාගයන් හමුවේ කිසිඳු ආකාරයක සාධනීය ප්‍රතිඵලයන් අත්කර ගත නොහැකි වූයේය.

මේ තත්ත්වය තුළ එක් අතකින් ජ.වි.පෙ. මර්දනය පිළිබඳ විමර්ශන වෙනත් ගමනාන්තයක් කරා ගොස් අවසන් වී තිබුණේය. අනෙක් අතින් ජ.වි.පෙ. නායකයින්ගේ හා සාමාජිකයින්ගේ මේ ආදර්ශමත් ජීවිත පරිත්‍යාග කිරීම් හමුවේ එතෙක් ආරක්ෂක හමුදා විසින් නඩත්තු කරගෙන පැමිණි මර්දන රැල්ල යම් අනපේක්ෂිත අතරමැදි තැනක ඇනහිට තිබෙන බව හමුදා ප්‍රධානීන්ට වැටහී ගොස් තිබුණහ. මේ තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ජ.වි.පෙ. අත්අඩංගුවට පත්වන සාමාජිකයින්ට තිරස්චීන ම්ලේච්ඡ වධබන්ධන පමුණුවාලීම වෙනුවට මානසික යුධ උපක්‍රම ක්‍රියාත්මක කෙරෙහි අවධානය යොමුකර තිබුනේය. ඒ අනුව අත්අඩංගුවට ගත් ජ.වි.පෙ. ඉහළ සාමාජිකයන්ට මාස ගණනාවක් තිස්සේ ඇදිවත පිටින්ම ලබා දී තිබූ කෲර වධ බන්ධන හා නින්දාසහගත වචන වෙනුවට මානසිකව දිනාගත හැකි පහසුකම් ලබාදී ප්‍රිය වචනවලින් ආමන්ත්‍රණය කිරීමේ උපදෙස් ලැබීමත් සමගම ජ.වි.පෙ. නායක රෝහණ විජේවීර හා උපනායක උපතිස්ස ගමනායක ඇතුළු දේශපාලන මණ්ඩල සභිකයින් වෙත ළඟාවීමේ මානසික යුධ උපක්‍රම නැමති මාර්ගය විවර කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණේ 1986 - 1989 දෙවන සන්නද්ධ අරගලය මර්දනයට ලක් වූයේ යන්න මගේ නිගමනයයි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


*අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත,* (1972). කොළඹ : රජයේ මුද්‍රණාලය

*අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා රැස්වීම් වාර්තාව,* (1973). කොළඹ : යතුරු ලියන පිටපතකි.

*1971 අප්‍රියෙල් මහ නඩුවේ සැකකරුවන්ගේ පොලිස් ප්‍රකාශ අඩංගු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වාර්තාව,* (1971).

*තරුණයින් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාව*, (1990). කොළඹ : ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

*1988.12.19 දෙවන ජනාධිපතිවරණය පිළිබඳ පශ්චාත් මැතිවරණ කොමසාරිස් වාර්තාව,* (1992). කොළඹ : මැතිවරණ දෙපාර්තමේන්නතුව.

*අප මරාදැමුවද අප නගන හඬ සදා නොමියෙනු ඇත.* (1997). රාජගිරිය : නියමුවා ප්‍රකාශන

*අමරණීය විප්ලවාදියා* (1990). රාජගිරිය : ජ.වි.පෙ. 10 වන ඉල්මහ විරු සමරු ප්‍රකාශනයකි.

අයිවන්, වික්ටර් (1989). *අර්බුදයේ ගමන් මග*, ගල්කිස්ස : රාවය ප්‍රකාශන

අයිවන්, වික්ටර් (1990). *ශ්‍රී ලංකාවේ නූතන කැරලිකරුවන්ගේ සමාජ පසුබිම*, නුගේගොඩ : දූර්ගා ප්‍රකාශකයෝ

ආරියරත්න, සම්පත් (2000). *80 දශකයෙහි සිංහල තරුණ කැරැල්ලේ ප්‍රචණ්ඩ පසුබිම*, රත්මලානඃ නන්දන මාරසිංහ අනුස්මරණ ග්‍රන්ථ ප්‍රකාශන සමාගම

ගුණසේකර, ආර්, (2000). *1971 - 1989 අහිමි වූ පරපුර*, ඇතුල් කෝට්ටේ : ඒ.එස්. ප්‍රකාශකයෝ

චේගුවේරා, අර්නස්ටෝ (2004). *ගරිල්ලා යුධ ක්‍රම*, කොළඹ : සංචිත ප්‍රකාශන

චේගුවේරා, අර්නස්ටො (2014). - *බොලීවීනියානු දිනපොත*, පරිවර්තනය ශාන්ත ජයසේන සහ අශෝකා නිල්මිණි, කොළඹ : කඩුල්ල ප්‍රකාශකයෝ

ට්‍රොට්ස්කි, ලියොන් (1975). - *ඔක්තෝබරය වෙනුවෙන්,* පරිවර්තනය පර්සි වික්‍රමසේකර, කොළඹඃ ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රකාශනයකි.

සිල්වා, දේව මයිකල් (2012). *දයාබර චේ*, ජා-ඇල : සමන්ති ප්‍රකාශකයෝ

සිල්වා, දේව මයිකල් (1988 - 1989). *ප්‍රමුදිත සටහන්*

දසනායක, පි.බි. සහ තවත් අය, (2017). *71 නොනිමි අරගලය*, කොළඹ : අප්‍රේල් - සහෝදරත්වය ප්‍රකාශන

දිසානායක, වසන්ත... සහ වෙනත් අය, (1995). *ජ.වි.පෙ. ප්‍රභවය, විකාශය හා දේශපාලනය*, කොළඹ : දියැස ප්‍රකාශන

දිසානායක, එස්.බි, (2009). *ජනතා විමුක්ති පෙරමුණු 71 කැරැල්ලෙන් ඔබ්බට*, කොළඹ : සුරක්ෂා ප්‍රකාශකයෝ

බණ්ඩාර, චාමින්ද, (2012). *හැත්තෑ එකෙන් අසූ නවයට*, කොළඹ : සරසවි ප්‍රකාශකයෝ

බෝපගේ, ලයනල් (1977). *ජාතික ගැටලුව ගැන මාක්ස්වාදි විග්‍රහයක්*, කොළඹ : නියමුවා ප්‍රකාශන.

මල්ලිමාරච්චි, ජනක (2014). *රතු අඟුරු*, කොළඹ : මල්ලිමාරච්චි ප්‍රකාශකයෝ

මුණසිංහ, රෝහිත (2012). *මර්දනය සඳහා කැරැල්ලක් ඕනෑකර තිබේ*, කොළඹ : කර්තෘ ප්‍රකාශන

මුණසිංහ, රෝහිත (2015). *ජ.වි.පෙ. සැඟවුණු ඉතිහාසයෙන් බිඳක් 2*, කෙළඹ : සුරස ප්‍රකාශකයෝ

මුණසිංහ, රෝහිත (2016). *උපනායක උපතිස්ස ගමනායක,* කොළඹ : සරසවි ප්‍රකාශකයෝ

රත්නායක, ඒ.ඩී.වි. හා වෙනත් අය (2012). *ජන අරගල ව්‍යාපාරයට අභියෝගයක් වන ජ.වි.පෙ. උරුමය*, කොළඹ : පීපල්ස් මාච් ප්‍රකාශනයකි.

රණවීර, හේමා, (1996). *ශ්‍රී ලංකාවේ ගැටුම්*, බත්තරමුල්ල : ජ )ᵇ ප්‍රින්ටර්ස් සමාගම

ලියනගේ, සරත් (1999). *ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ*, පොල්ගස්ඕවිට : සිකුරු ප්‍රකාශකයෝ

වර්ම්බ්‍රෑන්ඩ් රිචඩ් (1982). *මම විප්ලවවාදියෙක් වූයේ ඇයි ?,* පරිවර්තනය පැට්මෝ පෙරේරා, ජා-ඇල : කිතුනු දයා ක්‍රියාකාරි සංගමය

වික්‍රමරත්න, ධර්මන් (2016). *ජ.වි.පෙ. 2 වැනි කැරැල්ල ප්‍රථම කාණ්ඩය*, ශ්‍රී ජයවර්ධනපුර : කර්තෘ ප්‍රකාශන

*විජේවීරගේ බිරිඳ කියන කතාව* (2010). මහරගම : රාවය ප්‍රකාශන

විජේවීර, රෝහණ (1970). *සී.අයි.ඒ. කාරයෝ*, ගංගොඩවිල : රංජිත් ප්‍රින්ටින් වර්ක්ස්

විජේවීර, රෝහණ , (1979). *රතු ඔක්තෝබරයේ පාඩම්*, කොළඹ : නියමුවා ප්‍රකාශනයකි.

විජේවීර, රෝහණ (1987). *මේ හැර අන් මග අපට ඉතිරිව නැත*, අමුද්‍රිත ප්‍රකාශනයකි.

විජේවීර, රෝහණ (1991). *ඔක්තෝම්බර් විප්ලවයේ පාඩම්*, කොළඹ : ශක්ති මුද්‍රණාලය

විජේවීර, රෝහණ (2002). *දෙමළ ඊළම් අරගලයට විසඳුම කුමක්ද?,* කොළඹ : ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශනය

විජේවීර, රෝහණ (2911). *අත්දැකීම් කිහිපයක්*, බත්තරමුල්ල, නියමුවා ප්‍රකාශන

විජේවීර, රෝහණ (2012). *වියට්නාම් විප්ලවය ආරක්ෂා කරවු !* කොළඹ : නියමුවා ප්‍රකාශකයෝ

*විප්ලවීය ප්‍රතිපත්ති ප්‍රකාශය* (1977). කොළඹ : ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශනයකි.

වීරසූරිය, ගුණසිරි බණ්ඩා (2011). *සාපරාධී යුද සංග්‍රාම*, කොළඹ : ආරිය ප්‍රකාශකයෝ

වීරක්කොඩි, කාශ්‍යප, *සංහාරකයකුගේ පාපොච්චාරණය*, සත් හඬ, (2016).

*ලංකා විශ්වවිද්‍යාල ඉතිහාසය*, (1964). ලංකා විශ්වවිද්‍යාල ප්‍රකාශනයකි.

*ලෙනින් තෝරාගත් කෘති, වෙළුම 5* (1980). මොස්කව්, ප්‍රගති ප්‍රකාශන මන්දිරය. 112

සමරනායක, ගාමිණී (2002). *ශ්‍රී ලංකාවේ විප්ලවීය ව්‍යාපාරය : ජනතා විමුක්ති පෙරමුණ*, මහනුවර : ග්‍රැෆික් ලෑන්ඩ්

සමන්කුමාර, උදේනි, *මව්බිම*, හටන අතිරේකය, 2019

මින්, හවු වේ (2003). *සුන් - ට්සු ලියූ යුධ කලාව*, වේයන්ගොඩ: ප්‍රභා ප්‍රකාශකයෝ

Alles, A.C. (1999). *THE J.V.P. 1969 - 1989* Colombo : Lake House Investment Ltd.

Bernard Brodie (1976). *A guide to the reading of "On War"* Prinston : University Press.

Chandrapema, C.A. (1991). *Sri Lanka : The Year of Terror J.V.P. Insurrection 1987 - 1989,* Colombo : Lake House Investment Ltd.

Ronaid Haycock, keiba Neillison (1989). *Men, Machines and war,* Wilfird Laurier University Press ISBN 088920957

**දත්තදායක නාමාවලිය**

ජිනදාස කිතුලේගොඩ, අවුරුදු 72, 2014.04.01 පෙ.ව. 10.00 - ප.ව. 4.00, බත්තරමුල්ල: ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන කාර්යාලය

සෝමවංශ අමරසිංහ, අවුරුදු 71, 2014.04.15, පෙ.ව. 9.00 - ප.ව. 7.00, බත්තරමුල්ල: ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන කාර්යාලය

දයා වන්නිආරච්චි, අවුරුදු 69, 2014.04.30, පෙ.ව. 07 - ප.ව. 06, දෙබරවැව,තිස්සමහාරාමය